2019

# කාර්යසාධන වාර්තාව


වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථීක හා ප්‍රතිපත්ති සංවර්ධනඅමාත්‍යාංශය
මහා හාණ්ඩාගාරය
කොළඹ 01

## පටුන

.


**1** සංවිධාන රාමුව 1

1.1 හැඳින්වීම 1
1.2 දැක්ම 1
1.3 මෙහෙවර 1
1.4 අරමුණු 1
1.5 අභිමතාර්ථ 2
1.6 මූලික කාර්යයන් 3
1.7 සංවිධාන සටහන 6

**2** දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය 7

2.1 විශේෂ ජයග්‍රහණයන් 7
2.2 වෙළඳ ප්‍රතිපත්තිය 7
2.3 වෙළඳ ගිවිසුම් 8

2.3.1 වෙළඳ ගිවිසුම්වල කාර්යසාධනය 9

2.3.1.1 ක්‍රියාත්මක මට්ටමේ පවත්නා වෙළඳ ගිවිසුම් 9
2.3.1.1.1 ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ( ISFTA) 9
2.3.1.1.2 පකිස්තානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ( PSFTA) 11
2.3.1.1.3 දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) 13
2.3.1.1.4 ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) 15
2.3.1.1.5 ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම 17

2.3.1.2 සාකච්ජා මට්ටමෙහි පවතින වෙළඳ ගිවිසුම් 18
2.3.1.2.1 බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාව සඳහා වූ බහු ආංශික ගිවිසුම (BIMSTEC) 18
2.3.1.2.2 යෝජිත ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ගිවිසුම 20
2.3.1.2.3 යෝජිත චීන ශ්‍රී ලංකා වෙළඳ ගිවිසුම 20
2.3.1.2.4 යෝජිත ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම 20

2.3.2 නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ ජාත්‍යන්තර වෙළඳාම 21

2.4 වෙළඳාම් පහසුකරණය 23
2.4.1 වෙළඳාම් පහසුකරණ ගිවිසුම පිළිබඳ හැඳින්වීම සහ එහි බැඳීම් 23

2.5 ආනයන තීරුබදු ව්‍යුහය 25
2.5.1 2019 වසරේදී සංයෝජිත වර්ගීකරණ පද්ධතියට අලුතින් එකතු කරන ලද ජාතික උපබෙදීම් සංකේතාංක 26
2.5.2 1962 අංක 19 දරණ ආදායම් සංරක්ෂණ ආඥා පනත යටතේ සිදුකල සංශෝධන 29
2.5.3 2007 අංක 48 දරණ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත 31

2.6 බන්ධිත ගුදම් 39
2.7 විදේශ විනිමය පනත ක්‍රියාත්මක කිරීමේ කටයුතු සම්බන්ධීකරණය 41
2.8 රේගු කටයුතු පිළිබඳ අභියාචනා 44
2.9 අධිකරණ නඩු 45

2.10 විශේෂ ව්‍යාපෘති 45
2.10.1 රාජ්‍ය නිලධාරීන් සඳහා සහනදායී කොන්දේසි මත වාහන ආනයනය කිරීම 45

සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ යෝජනා ක්‍රමය
2.10.2 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 යටතේ බලපත්‍ර ලබාදීම 45
2.10.3 රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 210 යටතේ සහනදායී කොන්දේසි මත මෝටර් රථ ආනයනය කිරීමේ යෝජනා ක්‍රමය 46
2.10.4 විවිධ බදු සහන යටතේ ආනයනය කරන ලද වාහන අපහරණය කිරීම 46
2.10.5 බදු නිදහස් කිරීම් 46
2.10.6 අපනයන සැකසුම් යෝජනා ක්‍රමය සඳහා ආනයනය 49

2.11 වෙනත් අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සකස් කිරීම සහ මෙම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම 50

2.12 සාර්ක් සංවර්ධන අරමුදල (SDF) 50

**3 2019.12.31 දිනෙන් අවසන් වසර සඳහා සමස්ථ මූල්‍ය කාර්යසාධනය** 53

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය 53
3.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 54
3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 55
3.4 මූල්‍ය ප්‍රකාශන සටහන් 56
3.5 ආදායම් රැස්කර ගැනීමේ කාර්යසාධනය 64
3.6 ප්‍රතිපාදන භාවිතා කිරීමේ කාර්යසාධනය 64
3.7 මු.රෙ 208, අනුව වියදම් දැරීම සඳහා මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 64
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීම - 2019 65
3.9 විගණකාධිපති වාර්තාව -2019 66

**4 කාර්යසාධන දර්ශක** 71

**5 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීම පිළිබඳ කාර්යසාධනය** 73

5.1 තිරසර සංවර්ධන ඉලක්ක 73

**6 මානව සංවර්ධන පැතිකඩ** **76**

6.1 කාර්ය මණ්ඩල කලමනාකරණය **76**
6.2 මානව සම්පත් සංවර්ධන වැඩසටහන් **76**

**7 අනුකූලතා වාර්තාව** 80

## වගු


| | | |
|---|---|---|
| වගුව 2.1 | 2019 වසරේදී ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදු කරන ලද ආනයන | 9 |
| වගුව 2.2 | 2019 වසරේදී ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදු කරන ලද අපනයන | 10 |
| වගුව 2.3 | ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදු කරන ලද මුළු ආනයන හා අපනයන වටිනාකම - 2018 / 2019 | 11 |
| වගුව 2.4 | පකිස්ථානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදුකල ආනයන - 2019 | 11 |
| වගුව 2.5 | පකිස්ථානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදුකල අපනයන - 2019 | 12 |
| වගුව 2.6 | පකිස්ථානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් සිදුකරන ලද මුළු ආනයන හා අපනයන වටිනාකම - 2018/ 2019 | 13 |
| වගුව 2.7 | දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) යටතේ ශ්‍රී ලංකාව සිදුකල ආනයන - 2019 | 14 |
| වගුව 2.8 | දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) යටතේ ශ්‍රී ලංකාව සිදුකල අපනයන - 2019 | 14 |
| වගුව 2.9 | දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) යටතේ ශ්‍රී ලංකාව සිදුකල අපනයන හා ආනයන වටිනාකම - 2018/ 2019 | 15 |
| වගුව 2.10 | ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදුකරන ලද ආනයන - 2019 | 16 |
| වගුව 2.11 | ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදුකරන ලද අපනයන - 2019 | 17 |
| වගුව 2.12 | ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදුකරන ලද මුළු ආනයන හා අපනයන වටිනාකම - 2018/ 2019 | 17 |
| වගුව 2.13 | 2019 වර්ෂය තුල වෙළඳ ගිවිසුම් යටතේ ශ්‍රී ලංකාවේ ආනයන/ අපනයන පිලිබඳ තොරතුරු | 21 |
| වගුව 2.14 | 2019.12.31 දිනට තීරුබදු ව්‍යුහය | 25 |
| වගුව 2.15 | 2011 සිට 2019 දක්වා තීරුබදු ව්‍යුහයේ වෙනස්කම් | 26 |
| වගුව 2.16 | 2019 වර්ෂයේදී සංයෝජිත වර්ගීකරණ පද්ධතියට ඇතුලත් කරන ලද නව ජාතික උප බෙදීම් | 27 |
| වගුව 2.17 | 1962 අංක 19 දරණ ආදායම් සංරක්ෂණ ආඥා පනත යටතේ තීරුබදු වෙනස්වීම් | 30 |
| වගුව 2.18 | 2007 අංක 48 දරණ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ සිදුකරන ලද බදු සංශෝධන | 31 |
| වගුව 2.19 | 2017 අංක 12 දරණ විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ නිකුත් කල නව නියෝග සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට ඉදිරිපත් කල අමාත්‍ය මණ්ඩල සංදේශ | 41 |
| වගුව 2.20 | 2017 අංක 12 දරණ විනිමය පනත යටතේ නිකුත් කර ඇති නියෝග හා නියමයන් සඳහා යෝජිත සංශෝධන සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට ඉදිරිපත් කල අමාත්‍ය මණ්ඩල පත්‍රිකා | 41 |
| වගුව 2.21 | 2017 අංක 12 දරණ විනිමය පනතේ අංක 11 වගන්තිය යටතේ ඇමතිතුමා විසින් ප්‍රදානය කරන ලද අනුමැතීන් | 43 |
| වගුව 2.22 | රේගු කටයුතු පිළිබඳ අභියාචනා | 44 |
| වගුව 2.23 | රේගු ආඥාපනතේ 19(අ) වගන්තිය යටතේ 2019 වසරේදී පිරිනමනු ලැබූ බදු කපාහැරීම් | 46 |
| වගුව 2.24 | රේගු ආඥාපනතේ 19(අ) වගන්තිය යටතේ තීරුබදු කපාහැරීම් | 47 |
| වගුව 6.1 | 2019.12.31 දිනට අනුමත කාර්ය මණ්ඩලය | 76 |
| වගුව 6.2 | 2019 වසරේදී දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා, අධ්‍යන චාරිකා, සම්මන්ත්‍රණවලට සහභාගී වීම් පිළිබඳ විස්තර | 76 |

# 1. සංවිධාන රාමුව

## 1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ආර්ථිකයේ සහ ජනතාවගේ යහසාධනය උදෙසා විදේශ වෙළදාම, ආයෝජන, දේශීය කර්මාන්ත සහ කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් තිරසාර තීරුබදු ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වේ. 2006 වර්ෂයේ ජුනි මාසයේදී මෙම දෙපාර්තමේන්තුව වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වශයෙන් මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරය යටතේ නම් කරන ලද්දේ රටේ ආර්ථිකය ජාත්‍යන්තරය හා ඒකාබද්ධ කිරීම ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැපයීමේ පුළුල් පරමාර්ථයෙනි. දෙපාර්තමේන්තුවේ කාර්යයන් වඩාත් පුළුල් කිරීම සඳහා "වෙළඳ සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව" වශයෙන් 2012 වර්ෂයේදී නැවතත් මෙහි නම වෙනස් කරන ලදී.

දෙපාර්තමේන්තුව විසින් ස්වකීය ප්‍රධාන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මේ වන විට පහත සඳහන් පරිදි අංශ දෙකක් ස්ථාපනය කරන ලදි.

I. වෙළඳ අංශය
II. පරිපාලන හා මූල්‍ය අංශය

## 1.2 දැක්ම

රටේ සමස්ථ සංවර්ධනය උදෙසා වෙළඳාම හා ආයෝජනය තුළ ප්‍රගතිගාමී ප්‍රතිපත්ති සුරක්ෂිත කිරීම.

## 1.3 මෙහෙවර

සමස්ථ සංවර්ධනය උදෙසා ජාත්‍යන්තර ආර්ථික වෙළඳ පද්ධතියට පහසුකම් සැලසීම සඳහා වෙළඳ හා ආයෝජනයට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම.

## 1.4 අරමුණු

- කර්මාන්ත හිතකාමී තීරු බදු ක්‍රමවේදයක් ඇති කිරීම
- ව්‍යාපාර පහසු කිරීම් දර්ශකය අනුව ශ්‍රී ලංකාව පලමු රටවල් 50 අතරට ගෙන ඒම
- තරඟකාරී වාසි ලැබෙන පරිදි වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම
- රජයේ ආර්ථික හා සමාජීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බදු සම්මුතීන් ක්‍රියාත්මක කිරීම
- දකුණු ආසියානු කලාපය තුළ ඍජු විදේශ ආයෝජන සඳහා කේන්ද්‍රස්ථානය ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම

## 1.5 අභිමතාර්ථ

- ආයෝජන අධෛර්යමත් කරන සීමා ඉවත් කිරීම.
- අපනයන සැකසුම් යෝජනා ක්‍රම සඳහා තාවකාලික ආනයනය කිරීම් හා බන්ධිත ගුදම් ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා අදාළ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා සංවිධානය කිරීම
- සේවාදායකටන්ට හිතකරවූ දත්ත පද්ධතියක් මඟින් අවශ්‍ය තොරතුරු සපයමින් ව්‍යවසායකයින්ට සහයෝගය දැක්වීම
- රාජ්‍ය නිලධාරීන් සඳහා සහනදායී වාහන බලපත්‍ර නිකුත් කිරීම විධිමත් කිරීම
- රටේ වෙළඳ ආර්ථිකයේ අසමමිතික ස්වභාවය තුළ අන්‍යෝන්‍ය ප්‍රතිලාභ පදනම් කරගෙන නිදහස් වෙළඳ ගිවිසුම් ප්‍රවර්ධනය කිරීම
- ගෝලීය වාසිසහගත වෙළඳාම/කර්මාන්ත වලට ප්‍රවේශවීමට ඉඩ සලසන්නාවූ නිදහස් වෙළඳ ගිවිසුම් ප්‍රවර්ධනය කිරීම

## 1.6 මූලික කාර්යයන්

**වෙළඳ ප්‍රතිපත්ති කාර්යයන්**

වෙළඳාම, කර්මාන්ත, කෘෂිකර්මාන්තය සහ නිදහස් වෙළඳ ගිවිසුම්වලට අදාළව තීරුබදු ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සංශෝධනය කිරීම පිළිබඳව වගකීම වෙළඳ ප්‍රතිපත්ති අංශය සතු වේ. එමෙන්ම, අභියාචනා සහ රෙගුලාසි ඇතුළත් රේගු පරිපාලන සහ තීරුබදු කටයුතු සම්බන්ධීකරණය ද මෙම අංශය යටතේ සිදු කෙරේ. තවද , මෙම අංශය මඟින් සහනදායී යෝජනා ක්‍රම යටතේ මෝටර් රථ ආනයනය කිරීමට අදාල කටයුතු සහ විවිධ බදු සහන යටතේ ගෙන්වන ලද වාහන අපහරණය කිරීමට අදාළ කටයුතු  සිදු කෙරේ. වෙළඳ අංශය විසින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් පහත දක්වා ඇති පරිදි වේ.

**වෙළඳ ප්‍රතිපත්තිය**

i. මෝටර් රථ ආනයන ප්‍රතිපත්තිය කලමනාකරණය කිරීම
ii. වෙළඳ / ව්‍යාපාර සංසඳ සංවිධානය කිරීම
iii. වෙළඳ ප්‍රතිපත්ති පිළිබඳ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීම
iv. වෙළඳාම පිළිබඳ ජාතික හා අන්තර්ජාතික සංවිධාන සමඟ සම්බන්ධීකරණය
v. වෙළඳ පාර්ශව කරුවන් විසින් වෙළඳ ප්‍රතිපත්තියට අදාළව ඉදිරිපත් කරන ලද ගැටළු විසඳීම
vi. අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා වෙළඳ, තීරුබදු ප්‍රතිපත්ති ප්‍රකාශ සකස් කිරීම
vii. වෙළඳ ප්‍රතිපත්තියට අදාළ අධිකරණ නඩු කටයුතු සඳහා පිළිතුරු සකස් කිරීම
viii. තීරුබදු ප්‍රතිපත්තිය හා සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ, නිරීක්ෂණ සහ සටහන් සකස් කිරීම
ix. වෙළඳ හා තීරුබදු වලට අදාළ අයවැය යෝජනා සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
x. රේගු ආඥා පනතේ රෙගුලාසි ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා පහසුකම් සැපයීම
xi. විදේශ විනිමය පනත යටතේ රෙගුලාසි ප්‍රසිද්ධියට පත්කිරීම, නියෝග නිකුත් කිරීම් සඳහා පහසුකම් සැලසීම
xii. තක්සේරුකරණය ද ඇතුළත්ව, රේගු නඩු පිළිබඳ අභියාචනා සමාලෝචනය කිරීම
xiii. රේගු පරිපාලනය පිළිබඳ විගණන වාර්තා සමාලෝචනය කිරීම
xiv. අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයන යෝජනා ක්‍රමය (TIEP) පිළිබඳ සම්බන්ධීකරණය
xv. බන්ධිත ගුදම් පහසුකම් පිළිබඳ ප්‍රතිපත්ති සම්බන්ධීකරණය

**තීරුබදු ප්‍රතිපත්තිය**

i. රේගු ආඥාපනතේ 19 (අ) වගන්ති යටතේ තීරුබදු ඉවත් කිරීම
ii. ආදායම් සංරක්ෂණ පනත ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම
iii. තීරුබදු විෂමතාවන්ට අදාළ දුක්ගැනවිලි විසඳීම
iv. සංයෝජිත වර්ගීකරණ ජාතික උප බෙදීම් කළමනාකරණය කිරීම

v. සංයෝජිත වර්ගීකරණවල අනුකූලතාව පවත්වා ගැනීම සහ අවශ්‍ය පරිදි එහි පිළිවෙළ මාරු කිරීම
vi. තීරුබදු ප්‍රතිපත්තියට අදාළ ගැටළු සහ විකල්ප විශ්ලේෂණය කිරීම
vii. විශේෂ භාණ්ඩ බදු පනත බලාත්මක කිරීම
viii. තීරුබදු ප්‍රතිපත්තිය සමාලෝචනය සහ යාවත්කාලීන කිරීම
ix. තීරුබදු ප්‍රතිපත්තිය පිළිබඳව පාර්ලිමේන්තු කටයුතු
x. තීරුබදු පිළිබඳ ජාතික සහ අන්තර්ජාතික සංවිධාන සමඟ සම්බන්ධීකරණය
xi. පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන තීරුබදු පිළිබඳ ගැටළු නිරාකරණය කිරීම
xii. අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා තීරුබදු ප්‍රතිපත්ති ප්‍රකාශ සකස් කිරීම
xiii. තීරුබදු ප්‍රතිපත්තියට අදාළ අධිකරණ නඩු කටයුතු සඳහා පිළිතුරු සකස් කිරීම

**නිදහස් වෙළඳ ගිවිසුම්**

i. නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ ක්‍රියාත්මක කරනු ලබන මූලා ප්‍රතිපත්තිය විශ්ලේෂණය කිරීම
ii. ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ ගිවිසුම්වලට අනුව වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනය සහ යාවත්කාලීන කිරීම
iii. පහත දැක්වෙන ගිවිසුම්වලට අදාළ තීරුබදු ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම

- ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)
- පකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)
- ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)
- ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA)
- බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාව සඳහා වූ බහු පාර්ශවීය ගිවිසුම (BIMSTEC)
- යෝජිත චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA) සහ
- ආර්ථික හා තාක්ෂණ සහයෝගීතා ගිවිසුම (ETCA)

**විශේෂ ව්‍යාපෘති**

i. රාජ්‍ය නිලධාරීන් සඳහා සහනදායී පදනම මත මෝටර් රථ ලබා ගැනීම සඳහා වන යෝජනා ක්‍රමය

ii. රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 22/99 යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර

iii. විදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 210 යටතේ, රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් සඳහා සහනදායී පදනම මත මෝටර් රථ ආනයනය කිරීමේ යෝජනා ක්‍රමය

iv. විවිධ තීරු බදු සහන යෝජනා ක්‍රම යටතේ ආනයනය කරනු ලැබූ මෝටර් රථ අපහරණය කිරීම

v. රේගු ආඥා පනත යටතේ රේගු බදු ඉවත් කිරීම

iv. අපනයන සැකසුම් යෝජනා ක්‍රමය (TIEP) යටතේ ආනයනය කිරීම්

v. වෙනත් අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සකස් කිරීම සහ මෙම දෙපාර්තමේන්තුවට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම

vi. සාර්ක් සංවර්ධන අරමුදල

**පරිපාලන හා මූල්‍ය අංශය**

මානව, භෞතික වත්කම් සහ මූල්‍ය සම්පත් කළමනාකරණය සම්බන්ධ වගකීම පරිපාලන හා මූල්‍ය අංශය වෙත පැවරේ. දෙපාර්තමේන්තුව වෙත බඳවාගත් නිලධාරීන් ස්ථානගත කිරීම, නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සහ සුභසාධනය පිළිබඳ කාර්යයන් මානව සම්පත් කළමනාකරණයට ඇතුලත් වන අතර මූල්‍ය සහ භෞතික සම්පත් අත්පත් කර ගැනීම, නඩත්තු කිරීම සහ ඒවාට අදාල වාර්තා පවත්වා ගැනීම පිළිබඳ කාර්යයන් මූල්‍ය සහ භෞතික සම්පත් කළමනාකරණයට අයත් වේ.

## 1.7 සංවිධාන සටහන




ස.අ : සහකාර අධ්‍යක්ෂ
ප.නි : පරිපාලන නිලධාරි
තො.තා.නි : තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි
සං.නි : සංවර්ධන නිලධාරි
ප්‍ර.ක.සේ.නි : ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි
ක.සේ.නි : කළමනාකරණ සේවා නිලධාරි
කා.කා.ස : කාර්යාල කාර්ය සහායක

## 2.දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය

### 2.1 විශේෂ ජයග්‍රහණයන්

- 2016 වසරේ සිට රේගු ආඥාපනතේ 69 වගන්තිය යටතේ පොදු බන්ධිත ගුදම් ඇති කිරීම සඳහා ප්‍රතිපත්ති රාමුවක් හඳුන්වා දී තිබුණ ද පෞද්ගලික බන්ධිත ගුදම් ඇති කිරීම සඳහා ප්‍රතිපත්ති රාමුවක් හඳුන්වා දී නොතිබූ බැවින් ඒ පිළිබඳ ගැටළු මතුවී තිබුණි. 2019 වසරේදී මෙම දෙපාර්තමේන්තුව විසින් පෞද්ගලික බන්ධිත ගුදම් ඇති කිරීමේදී පැනනැඟී ඇති ගැටළු විසඳීම සඳහා අදාල පාර්ශවයන්ගේ ද සහභාගිත්වයෙන් නව ප්‍රතිපත්ති රාමුවක් හඳුන්වා දීමට කටයුතු කරන ලදී.

- රේගු ආඥාපනතේ 19(අ)(i) වගන්තිය යටතේ සිදුකරන ලද ආනයන වල තීරුබදු කපාහැරීමේ බලය මුදල් අමාත්‍යවරයා වෙත පවතී.රේගු ආඥාපනතේ 19(අ)(i) වගන්තිය යටතේ කපාහරින ලද තීරුබදු පිළිබඳ තොරතුරු ඇතුලත් ගැසට් පත්‍රයන් ප්‍රකාශයට පත්කර හැකි ඉක්මණින් පාර්ලිමේන්තුවේ සභාගත කිරිම කල යුතු වේ.2011 වසරේ සිට 2017 වසර දක්වා කපා හරින ලද තීරුබදු පිළිබඳ විස්තර ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවෙන් ලැබීමේ ප්‍රමාදය මත ගැසට් පත්‍රයන් මුද්‍රණය කොට පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට නොහැකි විය.

  කෙසේ නමුත්, 2019 වසර වනවිට 2011 වසරේ සිට 2018 වසර දක්වා තීරුබදු කපාහැරීම් පිළිබඳ තොරතුරු ඇතුලත් ගැසට් පත්‍රයන් මුද්‍රණය කොට පාර්ලිමේන්තුවේ සභාගත කිරිම සඳහා ඉදිරිපත් කිරීමට මෙම දෙපාර්තමේන්තුවට හැකිවිය.තවද ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවෙන් තීරුබදු කපාහැරීම් පිළිබඳ තොරතුරු ලබාගැනීම කඩිනම් කිරීම සඳහා ද ක්‍රියාමාර්ග ගනු ලැබීය.

### 2.2 වෙළඳ ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාව තුළ දේශීය නිෂ්පාදන ධාරිතාවය සහ වෙළඳ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම, කලාපීය සහ ලෝක වෙළඳපොළ තුළ ශ්‍රී ලාංකීය හවුල්කාරීත්වය සවිබල ගැන්වීම, මහජනතාවගේ ජීවන මට්ටම උසස් කිරීම සහ රටෙහි දිගුකාලීන ආර්ථික වර්ධනය වේගවත් කිරීම ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රතිපත්තිය මගින් අරමුණු කෙරේ.දේශීය කර්මාන්තයන්හි අපේක්ෂාවන් සඳහා පහසුකම් සලසන අතරවාරයේදීම ගෝලීය නිදහස් වෙළඳපොළ ආර්ථිකය තුළ පවතින ධනාත්මක අංශයන් සමඟ ශ්‍රී ලාංකීය සම්බන්ධතාව ඇති කිරීමේ අරමුණින් යුතුව රටෙහි වර්තමාන වෙළඳ පාලනයෙහි වැඩිදුර ලිහිල්කරණ ක්‍රියාවලියක් සමඟින් ක්‍රියාත්මක විදේශ වෙළඳාම, රටෙහි ආර්ථිකයෙහි අවිච්ඡින්න අංගයකි.

වර්තමානයේදී, ආනයන හෝ අපනයන පිළිබඳව බලපත්‍ර හෝ කෝටා ආදී සීමාකිරීම් බහුලව දැකිය නොහැකි අතර, භාණ්ඩ වෙළඳපොළ තුළ වෙළඳාම සඳහා සාධාරණ සමබර තත්ත්වයක් නිර්මාණය කිරීම සඳහා පවතින ප්‍රධාන මෙවලම් වශයෙන් තීරුබදු සහ දේශ සීමා බදු ක්‍රියාත්මක වෙමින් පවතී. විදේශ වෙළඳ අංශය තුළ සියලු පාර්ශවකරුවන් සඳහා විනිවිද භාවය සහ පූර්වානුමානයන් සිදුකළ හැකි රාමුවක් සැපයීම රජයේ තීරුබදු ප්‍රතිපත්තියෙහි අරමුණයි. ශ්‍රී ලංකාවෙහි වර්තමාන තීරුබදු ව්‍යුහය 0%, 15% සහ 30% වශයෙන් කාණ්ඩ 03 තීරුබදු ව්‍යුහයක් යටතේ 0% සිට 30% දක්වා පරාසයක පවතී. මෙයින් 0% ප්‍රතිශතය

අත්‍යාවශ්‍ය භාණ්ඩ සහ මූලික අමුද්‍රව්‍ය මතද 15% ප්‍රතිශතය අතරමැදි නිෂ්පාදන මතද 30% ප්‍රතිශතය වෙනත් නිමි නිෂ්පාදන මතද අදාළ වේ.

## 2.3 වෙළඳ ගිවිසුම්

තීරුබදු, ආනයන කෝටා, අපනයන සීමා කිරීම් සහ වෙනත් වෙළඳ තීරුබදු අඩු කිරීම / ඉවත් කිරීම තුළින් බහු පාර්ශවික සහ ද්වීපාර්ශවික වෙළඳ ගිවිසුම්, වාණිජ සබඳතා වැඩිදියුණු කිරීම සහ වෙළඳාම හා ආයෝජන පහසුකරණයත් සම්බන්ධයෙන් හිතකර වේ. බොහෝවිට වෙළඳ ගිවිසුම් තුළට ආයෝජනය පිළිබඳ සහතිකවීමක් ඇතුළත් වන අතර මෙම වෙළඳ ගිවිසුම් මඟින් වෙළඳ හිඟය පියවා ගැනීම සඳහා ද සහාය ලැබේ. තීරුබදු, තීරුබදු නොවන බදු සහ සමස්ත තහනම් කිරීම් වැනි ඒකපාර්ශවික වෙළඳ බාධක මඟින් ජාත්‍යන්තර වෙළඳාම නිරන්තර නියාමනයට ලක් වේ. රටවල් කිහිපයක් හෝ කලාප කිහිපයක්, වෙළඳ බාධක අඩු කිරීම සඳහා එකඟ වන විට ජාත්‍යන්තර වෙළඳාමෙන් ලැබෙන ආර්ථික වාසි සවිබල ගැන්වීමටත් වැඩිදියුණු කිරීමටත් ඉඩ ලැබේ. ශ්‍රී ලංකාව ද වෙළඳ ගිවිසුම් ගණනාවක් සම්බන්ධයෙන් අත්සන් තැබූ පාර්ශවයකි.

ක්‍රියාත්මක මට්ටමේ පවත්නා වෙළඳ ගිවිසුම්

- ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)
- පකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)
- ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)
- ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA)

සාකච්ඡා මට්ටමේ පවතින වෙළඳ ගිවිසුම්

- බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාව සඳහා වූ බහු පාර්ශවීය ගිවිසුම (BIMSTEC)
- ආර්ථික හා තාක්ෂණ සහයෝගීතා ගිවිසුම (ETCA)
- යෝජිත චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA) සහ
- ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම

වෙළඳ ලිහිල්කරණයෙහි මූලික අදියරයන්හිදී ශ්‍රී ලංකාව විසින් ඇතුළත් වූයේ භාණ්ඩ වෙළඳාම් ලිහිල්කරණය කෙරෙහි වැඩි වශයෙන් අවධානය යොමු කරන ලද ද්වීපාර්ශවික හා බහු පාර්ශවික නිදහස් වෙළඳ ගිවිසුම්වලටය. ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA), පකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) ද්වීපාර්ශවික නිදහස් වෙළඳ ගිවිසුම්වලට උදාහරණ වේ. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) සහ ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) භාණ්ඩ වෙළඳාම ලිහිල්කරණය

පිළිබඳව බහුපාර්ශවික වෙළඳ ගිවිසුම් වේ. පසුකාලීන අදියරයන්හි දී මෙමගින් සේවා වෙළඳාම, ආයෝජනය හා රේගු සංස්ථාපනය වැනි අංශයන් කෙරෙහි අවධානය යොමු කර තිබුණි.

වෙළඳ ගිවිසුම්වලට ඇතුළත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන අරමුණු වන්නේ මෙරට ප්‍රබල කර්මාන්තයන් සංවර්ධනය කොට ආරක්ෂා කර ගන්නා අතරවාරයේම ඉහළ ඒක පුද්ගල ආදායමක් හිමිකර ගැනීම, සංචාරක පාරාදීසයක් බවට පත් වීම සහ කලාපය තුල ආයෝජන කේන්ද්‍රයක් බවට ප්‍රවර්ධනය වීමයි. සුදුසු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහාත්, පරිපූර්ණ ආර්ථික සහයෝගීතාවය සඳහා රාමු නිර්මාණය කිරීම තුළින් සේවා වෙළඳාම සඳහා හිතකර පරිසරයක් ගොඩ නැංවීම සඳහා ඉහළ ප්‍රමුඛත්වය ලබා දෙන ලදී.

### 2.3.1 වෙළඳ ගිවිසුම්වල කාර්යසාධනය

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, වාණිජ දෙපාර්තමේන්තුවෙහි උපදෙස් ඇතිව වෙළඳ ගිවිසුම් යටතේ තීරුබදු සංශෝධන ක්‍රියාත්මක කිරීම සඳහා පසු විපරම් සිදු කරන ලදී. ඒ අනුව, තීරු බදු ලිහිල්කරණ වැඩසටහනද ඇතුළත්ව වෙළඳ ගිවිසුම් ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් පසුගිය වර්ෂය තුළදී පහත දැක්වෙන ප්‍රගතිය අත්කර ගෙන තිබේ.

#### 2.3.1.1. ක්‍රියාත්මක මට්ටමේ පවත්නා වෙළඳ ගිවිසුම්

#### 2.3.1.1.1 ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)

මෙම ගිවිසුම 1998 දෙසැම්බර් 28 වන දින අත්සන් කරනු ලැබ, 2000 මාර්තු 01 වන දින සිට බලාත්මකව පවතින අතර දෙරට අතර මෙම ආයෝජන ගිවිසුම හරහා ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර ද්වි පාර්ශවික වෙළඳාම හා ආයෝජනය වැඩිදියුණු කිරීම තුළින් දෙරටෙහි ආර්ථික සබඳතා ප්‍රවර්ධනය කිරීම අරමුණු කෙරේ. මෙම ගිවිසුම මගින් භාණ්ඩ වෙළඳාම පමණක් ආවරණය කරනු ලබන අතර දෙරට විසින් තීරුබදු රහිත පදනම හෝ සහන පදනම මත එකිනෙකාගේ අපනයන භාණ්ඩ සඳහා තම රටෙහි වෙළඳපොළ ප්‍රවේශය ලබා දිය යුතුය.

2019 වර්ෂයේදී ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමෙහි (ISFTA) කාර්යසාධනය පහත පරිදි වේ.

**2019 වර්ෂය තුළ ඉන්දියා ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ වැඩිම ආනයන භාණ්ඩ පහට (CIF වටිනාකම අනුව) අදාළ තොරතුරු පහත පරිදි වේ.**

**වගුව 2.1 - 2019 වසරේදී ඉන්දියා ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදුකළ ආනයන**

| සංයෝජිත වර්ගීකරණ සංකේතාංකය | විස්තරය | ප්‍රමාණය | CIF වටිනාකම |
|---|---|---|---|
| 72279000 | වෙනත් - වෙනත් මිශ්‍ර ලෝහ වලින් සැකසූ අවිධිමත් දඟර, හොට් රෝල්ඩ් බාර් සහ කූරු | 40,429,686 | 4,095,911,051 |
| 84181090 | වෙනත් - ශීතකරණ, අධිශීතකරණ සහ වෙනත් ශීත කිරීමේ සහ අධිශීත කිරීමේ උපකරණ, විද්‍යුත් හෝ | 74,602 | 2,643,787,542 |

| | | | |
|---|---|---|---|
| | වෙනත්, 84.15 ශීර්ෂය යටතේ දක්වා ඇති වායු සමනය යන්ත්‍ර හැර උෂ්ණත්ව පොම්ප | | |
| 84151022 | උෂ්ණත්වය, ආර්ද්‍රතාව වෙනස් කළ නොහැකි උපාංග සහිත වායු සමන යන්ත්‍ර ඇතුළුව උෂ්ණත්වය, ආර්ද්‍රතාව වෙනස් කළ හැකි උපාංග සහිත වායු සමන යන්ත්‍ර- (ධාරිතාවය 9000 -1200 BTU) | 44,646 | 2,020,535,634 |
| 70052900 | වෙනත් - පරාවර්තන ලේයරය සහිත හෝ රහිත එහෙත් වෙනත් සැකසුම් අඩංගු නොවන වීදුරු පුවරු | 2,977,873 | 1,410,047,249 |
| 23040000 | සෝයා බෝංචි තෙල් සිඳගැනීමෙන් පසු ඉතිරිවෙන මණ්ඩි සහ ඝන කොටස | 14,388,482 | 1,383,190,490 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව 2019

2019 වර්ෂය තුළ ඉන්දියා ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ වැඩිම අපනයන භාණ්ඩ පහට (FOB වටිනාකම අනුව) අදාළ තොරතුරු පහත පරිදි වේ.

**වගුව 2.2 - 2019 වසරේදී ඉන්දියා ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදුකළ අපනයන**

| සංයෝජිත වර්ගීකරණ සංකේතාංකය | විස්තරය | ප්‍රමාණය | FOB වටිනාකම |
|---|---|---|---|
| 23099030 | කුකුලු, තාරා ආදීන්ගේ සත්ත්ව ආහාර | 14,500,838 | 11,014,115,551 |
| 08028090 | වෙනත් - පියළි කළ/නොකළ, නැවුම් හෝ වියළි ඇට වර්ග | 5,715,030 | 3,646,703,960 |
| 85443000 | ජ්වලන රැහැන් පද්ධති සහ මෝටර් වාහන, ගුවන් යානා සහ නෞකා සඳහා භාවිත කරන වෙනත් විදුලි රැහැන් , වොල්ටීයතාවය වෝ.1000 ට නොවැඩි වෙනත් විද්‍යුත් සන්නායක | 1,913,592 | 3,408,003,742 |
| 47079000 | වෙනත් - කාණ්ඩ නොකළ කඩදාසි හෝ කඩදාසි පුවරු අපද්‍රව්‍ය | 77,688,806 | 2,652,399,247 |
| 15162000 | හයිඩ්‍රජනීයකරන ලද එහෙත් තවදුරටත් සකස් නොකළ එළවළු තෙල් හා මේදය. | 15,812,038 | 2,207,458,844 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, 2019

2018 වසරට සාපේක්ෂව, 2019 වසරේදී ඉන්දියා ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සිදු කළ මුලු අපනයන / ආනයන වටිනාකම් පිළිබඳ දත්ත පහත වගුවෙහි දැක්වේ.

වගුව 2.3 - ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදුකරන ලද මුළු ආනයන සහ අපනයන වටිනාකම 2018/2019

| 2018 | | 2019 | | 2018 සහ 2019 වර්ෂ අතර ආනයන වටිනාකමෙහි වෙනස % (CIF) | 2018 සහ 2019 වර්ෂ අතර අපනයන වටිනාකමෙහි වෙනස % (FOB) |
|---|---|---|---|---|---|
| ආනයන වටිනාකම(CIF) රු.මිලියන | අපනයන වටිනාකම(FOB) රු.මිලියන | ආනයන වටිනාකම(CIF) රු.මිලියන | අපනයන වටිනාකම(FOB) රු.මිලියන | | |
| **41,273** | **81,929** | **38,705** | **86,916** | **(6.22%)** | **6.09%** |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, 2018/2019

2018 වර්ෂයට සාපේක්ෂව, 2019 වර්ෂය තුළ, ආනයන වටිනාකම රුපියල් මිලියන 2,568 ක පහළ යෑමක් ද, අපනයන වටිනාකම රුපියල් මිලියන 4,987 ක ඉහළ යෑමක් ද සිදුව ඇති බව ඉහත වගුවෙන් පැහැදිලි වේ.

ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ පවතින කරුණු වර්තමාන ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතා ගිවිසුමෙහි (ETCA) රැස්වීම්වලදී සාකච්ඡාවට භාජනය වේ. 2019 වර්ෂයේදී, එම සාකච්ඡාවන් හි යම් ප්‍රමාදයක් සිදු වුවද, ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතා ගිවිසුම යටතේ වෙළඳ පහසුකරණය (Trade Facilitation) වැඩි දියුණු කිරීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව අදාළ පාර්ශවකරුවන් සමඟ ආර්ථික සාකච්ඡාවන් පවත්වා තිබේ.

### 2.3.1.1.2 පකිස්තානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)

2005 ජුනි 12 දින සිට බලාත්මක වූ මෙම ගිවිසුම හේතුවෙන් වෙළඳ අංශය තුළ සැලකිය යුතු වර්ධනයක් වාර්තා වී තිබේ. මෙම ගිවිසුම යටතේ වූ අවසන් අදියරෙහි වෙළඳ බැදීම ද පකිස්තානය විසින් 2009 මාර්තු මස ක්‍රියාවට නැංවූ අතර, වර්තමානයේ තීරු බදු රහිත නිෂ්පාදන 4500කට වැඩි සංඛ්‍යාවක් සඳහා ශ්‍රී ලංකාවට පකිස්තානු වෙළඳපොළ ප්‍රවේශය ඇත. එමෙන්ම මෙම ගිවිසුම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සතුව වෙළඳ බැදීම් අදියරයන් සියල්ල ද 2010 නොවැම්බරයේදී සපුරා ඇත.

2019 වර්ෂය තුල පකිස්ථානු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ආනයනය කරන ලද වැඩිම භාණ්ඩ පහට අදාල තොරතුරු CIF වටිනාකම මත පදනම්ව පහත දැක්වේ.

වගුව 2.4 - 2019 වර්ෂය තුළ පකිස්තානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදුකළ ආනයන

| සංයෝජිත වර්ගීකරණ සංකේතාංකය | විස්තරය | ප්‍රමාණය | CIF වටිනාකම |
|---|---|---|---|
| 10019910 | තිරිඟු ධාන්‍ය | 126,953,521 | 5,628,381,961 |
| 73063000 | වෙනත් - යකඩ හෝ මිශ්‍ර ලෝහ නොවන පෑස්සු චක්‍රීය හරස් කොටස | 4,749,743 | 716,002,426 |

| | | | |
|---|---|---|---|
| 70052900 | වෙනත් - පරාවර්තන ලේයරය සහිත හෝ රහිත එහෙත් වෙනත් සැකසුම් අඩංගු නොවන වීදුරු පුවරු | 908,205 | 470,235,222 |
| 08052110 | නැවුම් - පැඟිරි කුලයේ පළතුරු - නැවුම් හෝ වියළි | 6,465,541 | 299,188,174 |
| 10063040 | බාස්මතී සහ ලොන්ග් ග්‍රේන් වර්ගයේ සහල් | 1,950,000 | 237,602,468 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, 2019

2019 වර්ෂය තුළ පකිස්තානු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ වැඩිම අපනයන භාණ්ඩවලට (FOB වටිනාකම අනුව ) අදාළ තොරතුරු පහත සඳහන් පරිදි වේ.

**වගුව 2.5 - 2019 වර්ෂය තුළ පකිස්තානු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ අපනයන**

| සංයෝජිත වර්ගීකරණ සංකේතාංකය | විස්තරය | ප්‍රමාණය | FOB වටිනාකම |
|---|---|---|---|
| 14049020 | බුලත් කොළ | 4,217,903 | 3,053,971,586 |
| 12030000 | කොප්පරා | 3,939,350 | 915,414,139 |
| 08011200 | පොතු හරින ලද හෝ නොහරින ලද පොල්, බ්‍රසීල් නට්ස්, කජු | 11,267,459 | 834,771,990 |
| 44111490 | රෙසින් හෝ වෙනත් කාබනික ද්‍රව්‍ය එක් නොකළ මි.මී. 10 ඝනකමට නොවැඩි ෆයිබර් පුවරු | 18,448,759 | 824,329,395 |
| 58079000 | වෙනත් - එම්බ්‍රොයිඩර් නොකළ කැබලි, තීරු හෝ හැඩ වශයෙන් කැපූ රෙදි ලේබල, ලාංඡන | 69,601 | 345,507,704 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, 2019

2018 වසරට සාපේක්ෂව, 2019 වසරේදී පකිස්තානු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සිදුකළ අපනයන / ආනයන පිළිබඳ දත්ත පහත වගුවෙහි සඳහන් පරිදි වේ.

වගුව 2.6 - පකිස්තානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් සිදුකරන ලද මුළු ආනයන සහ අපනයන වටිනාකම - 2018/2019

| 2018 | | 2019 | | 2018 සහ 2019 | 2018 සහ 2019 |
|---|---|---|---|---|---|
| ආනයන වටිනාකම(CIF) රු.මිලියන | අපනයන වටිනාකම(FOB) රු.මිලියන | ආනයන වටිනාකම(CIF) රු.මිලියන | අපනයන වටිනාකම(FOB) රු.මිලියන | වර්ෂ අතර ආනයන වටිනාකමෙහි වෙනස % (CIF) | වර්ෂ අතර අපනයන වටිනාකමෙහි වෙනස % (FOB) |
| **12,062** | **8,772** | **7,822** | **10,882** | **(35.15%)** | **24.05%** |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, 2018/2019

2018 වර්ෂයට සාපේක්ෂව, 2019 වර්ෂය තුළ, ආනයන වටිනාකම රුපියල් මිලියන 4,240 ක පහළ යෑමක් ද, අපනයන වටිනාකම රුපියල් මිලියන 2,110 ක ඉහළ යෑමක් ද සිදුව ඇති බව ඉහත වගුවෙන් පැහැදිලි වේ. ඊට අමතරව, 2018 වර්ෂයේදී වෙළඳ හිඟයක් ඇතිවූ අතර 2019 වර්ෂයේදී රුපියල් මිලියන 3,060 ක වෙළඳ අතිරික්තියක් ඇති වී තිබේ.

**2.3.1.1.3 දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)**

සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම 1993 අප්‍රේල් මාසයේදී අත්සන් කරනු ලැබ 1995 දෙසැම්බර් සිට ක්‍රියාත්මක විය. මෙම ගිවිසුමෙහි අරමුණ වන්නේ, සහන සැලසීම මඟින් සාමාජික රටවල් අතර අන්‍යෝන්‍ය වෙළඳ සහ ආර්ථික සහයෝගීත්වය ප්‍රවර්ධනය කිරීමයි.

කෙසේ වෙතත්, වරණීය වෙළඳ ගිවිසුමකින් ඔබ්බට වර්ධනය වීමේත් කලාපය තුළ වඩා ඉහළ මට්ටමේ වෙළඳ හා ආර්ථික සහයෝගීත්වයක් දක්වා ගමන් කිරීමේත් අවශ්‍යතාවය සාමාජික රටවල් විසින් හඳුනාගෙන ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2004 ජනවාරි මාසයේදී ඉස්ලාමාබාද්හිදී සාර්ක් කවුන්සිලයේ අමාත්‍යවරු විසින් දකුණු ආසියානු නිදහස් වෙළඳ ප්‍රදේශය සම්බන්ධයෙන් ව්‍යුහාත්මක ගිවිසුමක් අත්සන් කරන ලදී. එය 2006 ජනවාරි 01 වන දින සිට බලාත්මක විය.

දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ එන තීරුබදු ලිහිල්කරණ වැඩසටහනෙහි (TLP) පළමු අදියර 2015 වසරේදී සම්පූර්ණ කරන ලදී. මෙම ගිවිසුමෙහි දෙවන අදියරෙහි තීරුබදු ලිහිල්කරණ වැඩසටහන යටතේ සංවේදී ලැයිස්තුවෙහි භාණ්ඩ කිහිපයක් නිදහස් කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. මේ සම්බන්ධයෙන් ඌන සංවර්ධිත නොවන රටවල් යටතේ වන, ඉතිරිව පවතින භාණ්ඩ ලැයිස්තු තීරුබදු ලිහිල්කරණ වැඩසටහනෙහි දෙවන කොටසෙහි අවසාන අදියරෙහිදී නිදහස් කිරීම සඳහා තෝරාගෙන ඇත. සාර්ක් රටවල් අතර ඇති අනාගත අන්‍යෝන්‍ය එකඟතාව මත වැඩසටහනෙහි තෙවන අදියර ක්‍රියාවට නැංවෙනු ඇත.

කලාපීය ආර්ථික ඒකාබද්ධතාවය පිළිබඳ සාර්ක් සංවිධානය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 04 වැනි විශේෂ රැස්වීම (II වැනි ඛණ්ඩය) 2019 ජූනි 24 -25 යන දිනවලදී කත්මණ්ඩු නගරයේදී පැවැත්විණි. සාර්ක් මහ ලේකම් කාර්යාලයෙහි නියෝජිතයන් ද ඇතුළුව, සාර්ක් සංවිධානයෙහි සියලුම සාමාජික රටවල් සහ

ආසියානු සංවර්ධන බැංකුවෙහි නියෝජිතයන් සහභාගීත්වයෙන් පැවැත්වූ මෙම රැස්වීමේදී සේවා වෙළඳාම පිළිබඳව සාකච්ඡා කරන ලදී.

දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) යටතේ 2019 වසරේ වැඩිම ආනයනය භාණ්ඩවලට (CIF වටිනාකම අනුව ) අදාළ සංයෝජිත වර්ගීකරණ කේතාංක 05 පහත සඳහන් පරිදි වේ.

**වගුව 2.7 – 2019 වර්ෂය තුළ දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) යටතේ සිදුකළ ආනයනය**

| සංයෝජිත වර්ගීකරණ සංකේතාංකය | විස්තරය | ප්‍රමාණය | CIF වටිනාකම |
|---|---|---|---|
| 84181090 | වෙනත් - ශීතකරණ, අධිශීතකරණ සහ වෙනත් ශීත කිරීමේ සහ අධිශීත කිරීමේ උපකරණ, විද්‍යුත් හෝ වෙනත්, 84.15 ශීර්ෂය යටතේ දක්වා ඇති වායු සමනය යන්ත්‍ර හැර උෂ්ණත්ව පොම්ප | 26,996 | 1,034,211,758 |
| 03069500 | කූනිස්සන් සහ ඉස්සන් | 860,083 | 176,957,940 |
| 64069091 | ඇතුළත පතුලට සවිකළ එසවුම සහිත පාවහන් | 486,856 | 92,457,524 |
| 48030000 | සනීපාරක්ෂක සහ ගෘහාශ්‍රිත කටයුතු සඳහා භාවිත කරන ටිෂූ කඩදාසි තොග, රෝල් හෝ ෂීට් වශයෙන් ඇති මතුපිට පාට කළ/ නොකළ, ගෙතූ /නොගෙතූ සෙලියුලෝස් කෙඳි පිරවුම් සහ ජාල | 309,842 | 63,318,009 |
| 87089110 | රේඩියේටර | 20,699 | 30,295,335 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, 2019

2019 වර්ෂය තුළ දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) යටතේ වැඩිම අපනයනය සහිත භාණ්ඩවලට (FOB වටිනාකම වටිනාකම අනුව ) අදාළ සංයෝජිත වර්ගීකරණ කේතාංක 05 පහත සඳහන් පරිදි වේ.

**වගුව 2.8 දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) යටතේ 2019 වර්ෂයේ අපනයන**

| සංයෝජිත වර්ගීකරණ සංකේතාංකය | විස්තරය | ප්‍රමාණය | FOB වටිනාකම |
|---|---|---|---|
| 08011190 | වෙනත්- වියළි / නැවුම්, ලේල්ල සහිත /රහිත පොල්, බ්‍රසීල් නට්ස් සහ කජු | 19,913,410 | 4,845,042,766 |
| 09041190 | වෙනත් - වියළි හෝ කුඩුකළ ජීනස් පයිපර් වර්ගයේ ගම්මිරිස්, මාලු මිරිස් | 1,068,400 | 1,302,558,164 |
| 09041120 | ලීටරයට ග්‍රෑ.450 ක ඝනත්වය ඉක්මවන මේරූ බෙරි | 765,841 | 1,004,911,878 |
| 09041111 | කාබනික - වියළි හෝ කුඩුකළ ජීනස් පයිපර් වර්ගයේ ගම්මිරිස්, මාලු මිරිස් | 550,000 | 720,247,512 |
| 09041119 | වෙනත් - වියළි හෝ කුඩුකළ ජීනස් පයිපර් වර්ගයේ ගම්මිරිස්, මාලු මිරිස් | 68,000 | 144,831,464 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, 2019

2018 වසරට සාපේක්ෂව, 2019 වසරේදී දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුම නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදුකළ අපනයන / ආනයන පිළිබඳ දත්ත පහත වගුවෙහි සඳහන් වේ.

**2.9 වගුව - දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදුකරන ලද මුළු අපනයන හා ආනයන වටිනාකම 2018 සහ 2019**

| 2018 | | 2019 | | 2018 සහ 2019 වර්ෂ අතර ආනයන වටිනාකමෙහි වෙනස % (CIF) | 2018 සහ 2019 වර්ෂ අතර අපනයන වටිනාකමෙහි වෙනස % (FOB) |
|---|---|---|---|---|---|
| ආනයන වටිනාකම(CIF) රු.මිලියන | අපනයන වටිනාකම(FOB) රු.මිලියන | ආනයන වටිනාකම(CIF) රු.මිලියන | අපනයන වටිනාකම(FOB) රු.මිලියන | | |
| **1,215** | **9,237** | **1,560** | **10,440** | **28.4%** | **13.02%** |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, 2018/2019

2018 වර්ෂයට සාපේක්ෂව, 2019 වර්ෂය තුළ, ආනයන වටිනාකම රුපියල් මිලියන තුන්සිය හතලිස් පහකින් ද (රු.මි. 345) , අපනයන වටිනාකම රුපියල් මිලියන එක් දහස් දෙසිය තුනකින් ද (රු.මි. 1,203) කින් ද ඉහළ යෑම සිදුව ඇති බව ඉහත වගුවෙන් පැහැදිලි වේ. ඊට අමතරව, 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේදී රුපියල් මිලියන 858 ක වෙළඳ හිඟයක් ද ඇති වී තිබේ.

**2.3.1.1. 4. ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)**

කලින් බැංකොක් ගිවිසුම වශයෙන් හැඳින්වූ 1975 දී අත්සන් කරන ලද ආසියා ශාන්තිකර නිදහස් වෙළඳ ගිවිසුම යනු, ආසියාව තුළ ක්‍රියාත්මක ඉපැරණි බහු පාර්ශවීය වරණීය වෙළඳ ගිවිසුම්වලින් එකකි. මෙම ගිවිසුමට බංගලාදේශය, චීනය, ඉන්දියාව, ලාඕසය, කොරියනු ජනරජය සහ ශ්‍රී ලංකාව යන රාජ්‍යයන් අයත් වේ.

ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යනු ශ්‍රී ලංකාව සඳහා හිතකර ප්‍රතිඵල ඇති කිරීම සම්බන්ධයෙන් බැහැර නොකළ හැකි බහු පාර්ශවීය ගිවිසුමකි. ශ්‍රී ලංකාව, චීනය සහ කොරියානු ජනරජය සමඟ වෙළඳාම් කිරීමට ඉඩ සලසන එකම වෙළඳ ගිවිසුම මෙය වන බැවින්, ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම ශ්‍රී ලංකාවට විශේෂයෙන් වැදගත් වේ.

සංයෝජිත වර්ගීකරණ 2017 සංශෝධනයෙහි සිව්වැනි වටය ක්‍රියාත්මක කිරීමෙන් පසුව ශ්‍රී ලංකා විසින් සියලුම රටවල් සඳහා තීරු බදු සංකේත 644 ක් ද (සංයෝජිත වර්ගීකරණ - 2017 වෙළුම) සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා 77 ක් වශයෙන් ද සඳහා තීරු බදු සහන ලබා දුන් අතර, පස්වැනි වටය ක්‍රියාත්මක කිරීම පිළිබඳව අවසන් තීරණ ගැනීම සම්බන්ධයෙන් 2019 වර්ෂයේදී, ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමෙහි ස්ථාවර කමිටුවෙහි 54,55 සහ 56 වැනි සාකච්ඡා වාර පවත්වන ලදී. පස් වැනි වටයෙහි සාකච්ඡා සඳහා තීරු බදු සහන පිරිනැමීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙහි තෝරාගැනීම් සහ එහි වරණ සීමා තවමත් ඉදිරිපත් කොට නැත.

ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ 2019 සඳහා වෙළඳ දත්ත පහත වගුවේ දැක්වේ.

2019 වර්ෂය තුළ ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ වැඩිම ආනයනය භාණ්ඩවලට (CIF වටිනාකම අනුව) අදාළ සංයෝජිත වර්ගීකරණ කේතාංක 05 පහත සඳහන් පරිදි වේ.

**වගුව 2.10 - 2019 වර්ෂය තුළ ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදුකරන ලද ආනයන.**

| සංයෝජිත වර්ගීකරණ සංකේතාංකය | විස්තරය | ප්‍රමාණය | CIF වටිනාකම |
|---|---|---|---|
| 85287299 | වෙනත් - එල්.සී.ඩී. තිර සහිත එහෙත් රූපවාහිනී සම්ප්‍රේෂණ උපාංග රහිත- රේඩියෝ සම්ප්‍රේෂණ උපාංග හෝ ශබ්ද හෝ වීඩියෝ පටිගත කිරීම හෝ ප්‍රති නිර්මාණය උපාංග සහිත/රහිත රූපවාහිනී සම්ප්‍රේෂණ උපාංග. | 32,792 | 946,050,340 |
| 73089000 | ව්‍යුහ (94.06 ශීර්ෂයෙහි සඳහන් දේ හැර) සහ ව්‍යුහ කොටස් - (උදා:- ව්‍යුහ සඳහා භාවිත කරන යකඩ හෝ වානේ වලින් සැකසූ පාලම් සහ පාලම් කොටස්, අගුලු ගේට්ටු, කුලුනු, ලැටිස් කුලුනු, වහළ, වහළ ආකෘති, දොර ජනෙල් සහ එහි උළුවසු, ෂටර, පඩිපෙළ කණු, ස්ථම්භ හා එවැනි දේ. | 6,945,366 | 827,929,683 |
| 39259000 | වෙනත් ස්ථානයන විශේෂයෙන් දක්වා නැති හෝ ඇතුලත් කොට නොමැති ඉදිකිරීම් සඳහා යොදගන්නා ප්ලාස්ටික් ද්‍රව්‍ය | 5,354,370 | 356,091,049 |
| 85362000 | ස්වයංක්‍රීය සර්කිට් බ්‍රේකර | 95,000 | 270,056,260 |
| 85287291 | වෙනත් - 32" ට නොවැඩි එල්.සී.ඩී. තිර සහිත එහෙත් රූපවාහිනී සම්ප්‍රේෂණ උපාංග රහිත - වෙනත්- රේඩියෝ සම්ප්‍රේෂණ උපාංග හෝ ශබ්ද හෝ වීඩියෝ පටිගත කිරීම හෝ ප්‍රතිනිර්මාණ උපාංග රහිත රූපවාහිනී තිර සහ ප්‍රොජෙක්ටර. | 13,028 | 189,025,224 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, 2019

2019 වර්ෂය තුළ ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ වැඩිම අපනයන භාණ්ඩවලට (FOB වටිනාකම අනුව) අදාළ සංයෝජිත වර්ගීකරණ කේතාංක 05 පහත සඳහන් පරිදි වේ.

වගුව 2.11 - 2019 වර්ෂය තුළ ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදුකරන ලද අපනයන

| සංයෝජිත වර්ගීකරණ සංකේතාංකය | විස්තරය | ප්‍රමාණය | FOB වටිනාකම |
|---|---|---|---|
| 09024092 | සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා සම්භවය සහිත බවට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සහතික කළ, - වෙනත් | 8,680,506 | 5,793,798,966 |
| 61099000 | වෙනත් රෙදිපිළි වර්ග වල - මැසූ හෝ ගෙතූ ටී ෂර්ට්, යට කමිස සහ බැනියම් | 2,415,344 | 2,158,244,986 |
| 38021022 | සක්‍රිය කාබන් - වෙනත් - පොල් කටු සුණු | 2,207,671 | 1,275,246,334 |
| 61046300 | කෘත්‍රිම කෙඳි වලින් සැකසූ මැසූ හෝ ගෙතූ - කාන්තාවන්ගේ/ ගැහැණු ළමුන්ගේ ඇඳුම්,ජැකට්,බ්ලේසර, ගවුම්, සාය, බෙදුණු සාය,කලිසම්, බරෙන්තු, ඕවරෝල්, සහ කොට කලිසම් ( පිහිනුම් ඇඳුම් හැර) | 701,198 | 1,221,975,001 |
| 53050023 | වෙනත් - මෙහි වෙනත් තැනක විශේෂයන් දක්වා හෝ ඇතුළත් කොට නොමැති රෙදිපිළි සඳහා ගන්නා සකස් කළ හෝ නොකළ එහෙත් නොඇඹරූ, නොගෙතූ කෙඳි - පොල්, ඇබකා (මැනිලා හණ හෝ මූසා) කෙඳි,මහදියදුල් හෝ වෙනත් ශාක කෙඳි | 25,659,300 | 1,016,795,093 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, 2019

වගුව 2.12 – ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදු කරන ලද මුළු ආනයන හා අපනයන වටිනාකම 2018/2019

| 2018 | | 2019 | | 2018 සහ 2019 වර්ෂ අතර ආනයන වටිනාකමෙහි වෙනස % (CIF) | 2018 සහ 2019 වර්ෂ අතර අපනයන වටිනාකමෙහි වෙනස % (FOB) |
|---|---|---|---|---|---|
| ආනයන වටිනාකම(CIF) රු.මිලියන | අපනයන වටිනාකම(FOB) රු.මිලියන | ආනයන වටිනාකම(CIF) රු.මිලියන | අපනයන වටිනාකම(FOB) රු.මිලියන | | |
| **3,076** | **108,018** | **3,763** | **31,045** | **22.33%** | **(71.26%)** |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, 2018/2019

### 2.3.1.1.5 ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම

ශ්‍රී ලංකා රජය 2018 ජනවාරි 23 වන දින සිංගප්පූරු රජය සමඟ නිදහස් වෙළඳ ගිවිසුමට ඇතුළත් වූ අතර, 2018 මැයි 01 දිනැති අංක 2069/02 අංක දරණ ගැසට් නිවේදනය මඟින් ප්‍රසිද්ධ කොට දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. ගිවිසුමට අදාළව ශ්‍රී ලංකාවෙහි පිළිවෙත සහ භාණ්ඩ සඳහා වෙළඳපොළ පිවිසුම පිළිබඳ කරුණු ගිවිසුමෙහි දෙවැනි පරිච්ඡේදයට ඇතුළත් වේ. සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම අනුව එහි 2.6 වගන්තිය යටතේ තිරුබදු නිදහස් කිරීමේ වැඩසටහන (ආනයන තීරුබදු අඩු කිරීම හෝ ඉවත් කිරීම) පහත සඳහන් ආකාරයෙන් ක්‍රියාත්මක වනු ඇත. එනම්, “පළමු වර්ෂය” හෙවත් ගිවිසුමට ඇතුළත් වූ වසර සහ පළමු වසරෙහි සිට ඊළඟ වසර වශයෙන් “දෙවැනි වර්ෂය” වශයෙනි.

- ✓ මෙම ගිවිසුම බලාත්මක වූ දිනයේ සිට “0”කාණ්ඩය යටතේ දක්වා ඇති, “Originationg goods” සඳහා තීරුබදු ඉවත් කරනු ඇත.
- ✓ පාර්ශ්වයක උපලේඛනයක, “6” කාණ්ඩය යටතේ දක්වා ඇති, “Originationg goods” සඳහා තීරුබදු ඉවත් කිරීම ගිවිසුම බලාත්මක වූ වර්ෂයෙහි දෙසැම්බර් මස 31 වැනි දින සිට වාර්ෂිකව සමාන අදියර හයකදී (06) සිදු කරනු ඇත. එවැනි භාණ්ඩ, සය වැනි (6) වසරෙහි දෙසැම්බර් 31 වැනි දින සිට ඕනෑම තීරු බද්දකින් නිදහස් වනු ඇත.

- ✓ පාර්ශවයක උපලේඛනයක, “10” කාණ්ඩය යටතේ දක්වා ඇති, “Originationg goods” සඳහා තීරුබදු ඉවත් කිරීම සය වැනි (6) වසරෙහි දෙසැම්බර් මස 31 වැනි දින සිට වාර්ෂිකව සමාන අදියර පහකදී (05) සිදු කරනු ඇත. එවැනි භාණ්ඩ, දස වැනි (10) වසරෙහි දෙසැම්බර් 31 වැනි දින සිට ඕනෑම තීරු බද්දකින් නිදහස් වනු ඇත.
- ✓ පාර්ශ්වයක උපලේඛනයක, “12” කාණ්ඩය යටතේ දක්වා ඇති, “Originationg goods” සඳහා තීරුබදු ඉවත් කිරීම සත් වැනි (7) වසරෙහි දෙසැම්බර් මස 31 වැනි දින සිට වාර්ෂිකව සමාන අදියර හයකදී (06) සිදු කරනු ඇත. එවැනි භාණ්ඩ, දොළොස් වැනි (12) වසරෙහි දෙසැම්බර් 31 වැනි දින සිට ඕනෑම තීරු බද්දකින් නිදහස් වනු ඇත.
- ✓ පාර්ශ්වයක උපලේඛනයක, “15” කාණ්ඩය යටතේ දක්වා ඇති, “Originationg goods” සඳහා තීරුබදු ඉවත් කිරීම එකොළොස් වැනි (11) වසරෙහි දෙසැම්බර් මස 31 වැනි දින සිට වාර්ෂිකව සමාන අදියර පහකදී (05) සිදු කරනු ඇත. එවැනි භාණ්ඩ, පහළොස් වැනි (15) වසරෙහි දෙසැම්බර් 31 වැනි දින සිට ඕනෑම තීරු බද්දකින් නිදහස් වනු ඇත.
- ✓ මෙම ගිවිසුම යටතේ “x” කාණ්ඩය යටතේ දක්වා ඇති භාණ්ඩ සම්බන්ධයෙන් රේගු බදු අදාළ වීම පිළිබඳ විරෝධතාවන් අදාළ කරගත නොහැක.

මෙම ගිවිසුමෙහි පළමු අදියර යටතේ සංයෝජිත වර්ගීකරණ කේත 3,721 ක් සඳහා තීරු බදු ඉවත් කොට ඇති අතර පිළිවෙළින් 2018.05.01 සහ 2018.07.19 දිනැති අංක 2069/2 සහ 2080/42 දරන ගැසට් පත්‍ර මගින් එම සංයෝජිත වර්ගීකරණ කේත ප්‍රකාශයට පත් කොට ඇත.

**2.3.1.2 සාකච්ඡා මට්ටමෙහි පවතින වෙළඳ ගිවිසුම්.**

**2.3.1.2.1 බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාව සඳහා වූ බහු ආංශික ගිවිසුම (BIMSTEC)**

බෙංගාල බොක්ක ආශ්‍රිත වෙරළබඩ තීරයේ සහ යාබද ප්‍රදේශවල පිහිටා ඇති කලාපීය ඒකාබද්ධතාවයෙන් යුතු සත් සාමාජික රටවලින් සැදි සංවිධානයකි. මෙම උප කලාපීය සංවිධානය 1997 ජූනි 06 වැනි දින සිට බැංකොක් ප්‍රකාශනය තුළින් ක්‍රියාත්මක විය. මෙම සංවිධානයට අයත් සාමාජික රටවල් හතෙන් රටවල් පහක් දකුණු ආසියානු රටවලිනි. එනම්, බංගලාදේශය, භූතානය, ඉන්දියාව, නේපාලය සහ ශ්‍රී ලංකාව වේ. සෙසු රාජ්‍යයන් වන්නේ අග්නිදිග ආසියාවට අයත් මියන්මාරය සහ තායිලන්තයයි. මෙම කලාපීය සංවිධානය

මඟින් දකුණු ආසියාව සහ අග්නිදිග ආසියාව අතර සබඳතාවයක් මෙන්ම සාර්ක් සහ ආසියානු සංවිධානවල සාමාජික රටවල් අතරද අන්තර් කලාපීය සහයෝගීතාවයක් නිර්මාණය කෙරේ.

බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාව සඳහා වූ බහු ආංශික ගිවිසුමෙහි මූලික අරමුණ වන්නේ බෙංගාල බොක්ක ආශ්‍රිත දකුණු ආසියාතික සහ අග්නිදිග ආසියාතික රටවල් අතර තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමයි. එමෙන්ම, 1997 අග භාගයේදී ආංශික සහයෝගීතාවය සඳහා වෙළඳාම සහ ආයෝජනය, තාක්ෂණය, බලශක්තිය, ප්‍රවාහනය, සංචාරක කර්මාන්තය සහ ධීවර කර්මාන්තය ඇතුළත් අංශ 06කින් ආරම්භ වූ මෙම සංවිධානය 2008 වර්ෂයේදී ඊට කෘෂි කර්මාන්තය, මහජන සෞඛ්‍යය, දිළිඳු බව තුරන් කිරීම, ත්‍රස්තවාදය පිටු දැකීම, පරිසරය, සංස්කෘතිය, මිනිසුන් අතර සබඳතාවය, දේශගුණික විපර්යාස යන අංශද ඇතුළත් කර ගනිමින් වඩාත් පුළුල් සංවිධානයක් බවට පත් විය.

වෙළඳාම සහ ආයෝජනය යනු බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාව සඳහා වූ ගිවිසුමේ ආරම්භක අදියරේදී පැවති අංශ හයෙන් එකකි. මේ යටතේ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාව සඳහා වූ ගිවිසුමේ නිදහස් වෙළඳ ප්‍රදේශය සම්බන්ධ ගිවිසුම 2004 පෙබරවාරි 08 වැනි දින තායිලන්තයේ ෆුකට් හිදී අත්සන් කරනු ලැබ 2004 ජූනි 30 දින සිට බලාත්මකව පවතී. මෙම ගිවිසුම යටතේ 2004 වර්ෂයේදී, වෙළඳ සාකච්ඡා කමිටුවක් (ශ්‍රී ලංකාවෙහි ස්ථාවර සභාපතීත්වය යටතේ) ස්ථාපිත කොට ඇති අතර මේ දක්වා සාකච්ඡා වට 20ක් පවත්වා තිබේ. මෙම වෙළඳ සාකච්ඡා කමිටුව විසින් භාණ්ඩ වෙළඳාම, සේවා වෙළඳාම, ආයෝජනය, පාරිභෝගිකයන් සම්බන්ධ කටයුතු පිළිබඳ අන්‍යෝන්‍ය සහාය, ප්‍රභවස්ථාන රීති සහ මෙහෙයුම් ක්‍රියා පටිපාටි, වෙළඳාම පහසුකරණ යන අංශ ගණනාවකට අදාළ ගිවිසුම් සම්බන්ධයෙන් සාකච්ඡා ආරම්භ කොට ඇත.

බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාව සඳහා වූ ගිවිසුමේ වෙළඳ සාකච්ඡා කමිටුවෙහි 21 වැනි රැස්වීම් වාරය 2018 නොවැම්බර් 18 – 19 යන දිනවල බංගලාදේශයේ ඩකා නුවරදී පැවැත්විණි.

එම රැස්වීමේදී වෙළඳ සාකච්ඡා කමිටුවෙහි 19 වන රැස්වීමේදී අනුගමනය කිරීමට එකඟ වූ ප්‍රකාර පිරිනැමුම් ලැයිස්තු (Offer list) සකස් කිරීමටත් ඒවා සංයෝජිත වර්ගීකරණ 2017 සංශෝධන තුළ ස්ථානගත කිරීමටත් තීරණය කරන ලදී. එසේ ස්ථානගත කිරීමෙන් පසුව, වෙළඳ සාකච්ඡා පිළිබඳව 19 වන රැස්වීමේදී එකඟ වූ ආකෘති භාවිතා කරමින් තීරුබදු අදාළ වීම 2017 අගෝස්තු මස 01 දින සිට සිදු වේය යන පදනම මත සංයෝජිත වර්ගීකරණ 2017 සංස්කරණයෙහි උපලේඛන සකස් කිරීමටත් මෙම උපලේඛන සාමාජික රටවල් අතර හුවමාරු කර ගැනීමටත් තීරණය කරන ලදී. ඊට අමතරව, 2017 අගෝස්තු 01 දිනට අදාළ කරගත හැකි තීරුබදු ඉවත් කිරීමේ / අඩු කිරීමේ පාදක අනුපාතයන් භාවිතා කිරීමටද තීරණය කරන ලදී.

එමෙන්ම, එකඟ වූ ප්‍රකාරය ඇතුළත තම පිරිනැමුම් ලැයිස්තු සංශෝධනය කිරීමට බලාපොරොත්තු වන රටවල්වලට මීට පෙර ඉදිරිපත් කරන ලද උපලේඛනවල තීරුබදුවලින් 10%ක් දක්වා සාමාජික රටවල් අතර හුවමාරු කෙරේ යන පදනමේ එසේ කළ හැකි බවටද තීරණය කරන ලදී.

සාමාජික රටවලින් ලැබෙන ස්වේච්ඡා අරමුදල් මෙම ගිවිසුම පිළිබඳව පර්යේෂණ සහ සැලසුම් කිරීමට සහ ව්‍යාපෘති මූල්‍යායනය වෙනුවෙන් යොදා ගැනීම සඳහා BIMSTEC සංවර්ධන අරමුදලක් පිහිටුවීමට ඇති හැකියාව පිළිබඳව සොයා බැලීම සඳහා 2018 අගොස්තු මස කත්මණ්ඩු නගරයේදී පැවති 4 වැනි සමුළුවේදී නියෝග ලබා දී තිබිණ.

වෙළඳ පහසුකරණය පිළිබඳ BIMSTEC හි ක්‍රියාකාරී සමූහයේ දෙවැනි රැස්වීම 2018 සැප්තැම්බර් 29 -30 යන දිනවල බංග්ලාදේශයේ ඩකා නුවරදී පැවැත්වූ අතර, එහිදී BIMSTEC වෙළඳ ගිවිසුමෙහි වෙළඳ පහසුකරණ ලේඛන සැකසීම පිළිබඳව සාකච්ඡා කරන ලදී. අදාළ සංවිධාන සමඟ සාකච්ඡා කිරීමෙන් පසු ඉහත ලේඛනවලට අදාළ නිරීක්ෂණ ඉදිරිපත් කොට ඇත.

**2.3.1.2.2 යෝජිත ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ගිවිසුම**

ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ගිවිසුම (ETCA) යනු ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර පවතින ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමටම යෝජිත එකතු කිරීමක් පිළිබඳ ක්‍රියාවලියකි. 2015 සැප්තැම්බරයේ සිදුකළ ශ්‍රී ලංකා අග්‍රමාත්‍යවරයාගේ ඉන්දීය සංචාරය අතරතුර දෙරටෙහි අගමැතිවරුන් විසින් ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ සාකච්ඡා කිරීමට එකඟ වී තිබේ. මේ වන විට මෙම ගිවිසුම පිළිබඳව සාකච්ඡා වාර 11 ක් පවත්වා ඇති අතර 11 වැනි වටයේ සාකච්ඡා වාරයන් 2018 ඔක්තෝම්බර් 3-5 දක්වා ශ්‍රී ලංකාවේ කොළඹ නගරයේදී පැවැත්විණි. මෙම සාකච්ඡා වාරයෙන් පසුව මේ දක්වා සාකච්ඡා ක්‍රියාවලිය සිදු කොට නැත.

**2.3.1.2.3 යෝජිත චීන ශ්‍රී ලංකා වෙළඳ ගිවිසුම**

චීනය හා ශ්‍රී ලංකාව අතර වෙළඳ ගිවිසුමක් ඇති කිරීම සම්බන්ධයෙන් 2014 මාර්තු මස පැවති ඒකාබද්ධ ශක්‍යතා අධ්‍යයනයෙහි ප්‍රතිඵල මත මෙම ගිවිසුම සම්බන්ධ 5 වැනි සහ 6 වැනි වටයේ සාකච්ඡා 2017 වසරේදී පැවැත්විණි. දෙපාර්ශවය විසින් භාණ්ඩ වෙළඳාම, සේවා වෙළඳාම, ආයෝජනය, ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාවය, වෙළඳ ප්‍රභව රීති, රේගු ක්‍රියා පටිපාටි සහ වෙළඳ පහසුකරණය, වෙළඳාම පිළිබඳ බාධක, සනීපාරක්ෂක හා ස්වස්ථතා මිනුම් සහ වෙළඳ ප්‍රතිකර්ම යන අංශයන්ට අදාළ ගැටළු පිළිබඳව අදහස් හුවමාරු කර ගන්නා ලදී. භාණ්ඩ හා සේවා වෙළඳාම සම්බන්ධ ආරම්භක සාකච්ඡා පවත්වන ලද 2017 වසරට පසුව, නැවත සාකච්ඡා පවත්වා නැත.

**2.3.1.2.4 යෝජිත ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම**

2018 ජූලි 12 වන දින ශ්‍රී ලංකා තායිලන්ත රාජ්‍ය නායකයන් අතරේ පැවැති වෙළඳ සාකච්ඡාවලින් අනතුරුව, ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳව පළමු වටයේ සාකච්ඡා 2018 ජූලි 13 වන දින කොළඹදී පැවැත්විණි. එහිදී දෙපාර්ශවයම ක්‍රියාකාරී කණ්ඩායම් 09කින් සැදී ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුමෙහි අකෘතිය, ක්‍රියාකාරී කණ්ඩායම්වල විෂය පථය සහ ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුමෙහි රැස්වීම් සඳහා වැඩසටහන සම්බන්ධයෙන් එකඟ විය. එමෙන්ම, භාණ්ඩ ආනයන මත දැනට පනවා ඇති තීරුබදු සහ ගාස්තු මත අදාළ කරගත හැකි වෙළඳ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් තොරතුරු හුවමාරු කර ගැනීමටද එකඟ විය.

2019 වර්ෂයේදී මෙම ගිවිසුම සම්බන්ධයෙන් සාකච්ඡාවන් පවත්වා නැත.

**2.3.2 නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ජාත්‍යන්තර වෙළඳාම**

නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ වෙළඳ දත්ත වගුව 2.6 මඟින් දැක්වේ.

**වගුව 2.13 - 2019 වර්ෂය තුල වෙළඳ ගිවිසුම් යටතේ ශ්‍රී ලංකාවේ ආනයන / අපනයන පිලිබඳ තොරතුරු**

| අංකය | වෙළඳ ගිවිසුම | ආනයන වටිනාකම (රු.මි.) | අපනයන වටිනාකම (රු.මි.) | නිදහස් වෙළඳ ගිවිසුම යටතේ වෙළඳ පරතරය(රු.මි) |
|---|---|---|---|---|
| 1 | ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) | 38,705 | 86,916 | 48,211 |
| 2 | පාකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ( PSFTA) | 7,822 | 10,882 | 3,060 |
| 3 | දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුම | 1,560 | 10,440 | 8,880 |
| 4 | ආසියා - ශාන්තිකර වෙළඳ ගිවිසුම | 3,763 | 31,045 | 27,282 |
| | **එකතුව** | **51,850** | **139,311** | **87,461** |

මූලාශ්‍රය : - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව , 2019

**2.1 රූප සටහන - නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ ආනයනය සහ අපනයන**






**2.2.** රූප සටහන - නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ **2018/ 2019** වර්ෂවල ශ්‍රී ලංකාවේ සමස්ත ආනයන සැසඳුම




**2.3.** රූප සටහන - නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ **2018/ 2019** වර්ෂවල ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන සසැඳුම



### 2.4 වෙළඳාම් පහසුකරණය

#### 2.4.1 වෙළඳාම් පහසුකරණ ගිවිසුම පිළිබඳ හැඳින්වීම සහ එහි බැඳීම්

වෙළඳ ක්‍රියාපටිපාටි සහ ලිපි ලේඛන සරල කිරීම, වෙළඳ භාවිතයන් සහ රීති සමායෝජනය ජාත්‍යන්තර ප්‍රවාහ පිළිබඳව විනිවිදභාවයෙන් යුතු ක්‍රියාපටිපාටි ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා නව තාක්ෂණික සහාය ලබා ගැනීම සහ ජාත්‍යන්තර වාණිජ කටයුතු සඳහා වඩාත් සුරක්ෂිත ගෙවීම් මාධ්‍යය භාවිතය යන මූලික ලක්ෂණ 05 වෙළඳ පහසුකරණට ඇතුලත් වේ. වෙළඳ පහසුකරණයෙහි ඉලක්ක වනුයේ වෙළඳ ගනුදෙනු වඩා පහසු හා කාර්යක්ෂම සහ අඩු පිරිවැයක් සහිත බවට පත්කොට එමඟින් වෙළඳ ප්‍රවාහ පහසුකරණය ඇති කිරීමයි. භාණ්ඩ හා සේවාවන්හි ආනයනය සහ අපනයන වඩා පහසුවට පත් කිරීම ඔස්සේ වෙළඳාම පහසුකරණ මිනුම් මඟින් සෘජු විදේශ ආයෝජන සඳහා සංවර්ධනය වෙමින් පවතින රටවල පවතින ආකර්ශනීයත්වය ද ඉහළ නංවනු ලැබේ. ගෝලීය අගය දාමයන් මත දැඩිව බැඳී පවතින ගෝලීය ආර්ථික පද්ධතියක් තුළ දේශ සීමා අතර වෙළඳාම පහසුකරණය යනු ඉතා වැදගත් කරුණකි.

ලෝක වෙළඳ සංවිධානයෙහි වෙළඳ පහසුකරණ ගිවිසුම මඟින් රේගු පටිපාටි විධිමත් කිරීම, සමායෝජනය සහ නව්‍යකරණය කිරීම අරමුණු කෙරේ. සංක්‍රමණ භාණ්ඩ ද ඇතුළත්ව භාණ්ඩ නිදහස් කිරීම සහ නිශ්කාෂණය කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා විධි විධාන මෙම ගිවිසුමට ඇතුලත් වේ. එමෙන්ම අන්තර් දේශ සීමා වෙළඳාම තුළ අදාළ අධිකාරයන් අතර සඵලදායක සහයෝගීතාවය සඳහා වන මිනුම් කිපයක් ඊට ඇතුලත්ය. වෙළඳාම් පහසුකරණ ගිවිසුම් මඟින් විනිවිදභාවය වැඩිදියුණු කිරීම, ගෝලීය අගය දාම හා සම්බන්ධවීමට ඇති හැකියාව ඉහළ නැංවීම සහ ප්‍රමාදයන් සහ බාධාවන් ඇතිවීමේ අවස්ථා අවම කර ගැනීම සඳහා ද සහාය ලැබෙනු ඇත.

වෙළඳ ක්‍රියාපටිපාටි සහ ලිපි ලේඛන සරල කිරීම, වෙළඳ භාවිතයන් සහ රීති සමායෝජනය ජාත්‍යන්තර ප්‍රවාහ පිළිබඳව විනිවිදභාවයෙන් යුතු ක්‍රියාපටිපාටි ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා නව තාක්ෂණික සහාය ලබා ගැනීම සහ ජාත්‍යන්තර වාණිජ කටයුතු සඳහා වඩාත් සුරක්ෂිත ගෙවීම් මාධ්‍යය භාවිතය යන මූලික ලක්ෂණ 05 වෙළඳ පහසුකරණට ඇතුලත් වේ.

ලෝක වෙළඳ සංවිධානයෙහි වෙළඳ පහසුකරණ ගිවිසුම මඟින් රේගු පටිපාටි විධිමත් කිරීම, සමායෝජනය සහ නව්‍යකරණය කිරීම අරමුණු කෙරේ. සංක්‍රමණ භාණ්ඩ ද ඇතුළත්ව භාණ්ඩ නිදහස් කිරීම සහ නිශ්කාෂණය කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා විධි විධාන මෙම ගිවිසුමට ඇතුලත් වේ.

ලෝක වෙළඳ සංවිධානයෙහි වෙළඳ පහසුකරණ ගිවිසුම කොටස් තුනකින් සමන්විත වේ.

**පළමු කොටස -** මෙමඟින් විවිධ වගන්තීන් 12ක් සහ සංක්‍රමණික භාණ්ඩද ඇතුළත්ව භාණ්ඩ සංචලනය, නිදහස් කිරීම හා නිෂ්කාශනය පිළිබඳව විධිවිධානද ඇතුලත් වේ.

**දෙවන කොටස -** මෙමගින් ගිවිසුමෙහි පරිච්ඡේද 10ක් ආවරණය කරනු ලබන අතර වෙළඳ පහසුකරණ ගිවිසුමෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී සංවර්ධනය වෙමින් පවතින රටවල් සහ ඌන සංවර්ධිත රටවල් විසින් මුහුණ පෑ හැකි ගැටළු පිළිබඳව හඳුන්වාදෙනු ලබන අතර, ඒ සම්බන්ධයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල් සහ ඌන සංවර්ධිත රටවල් සඳහා විශේෂ සහ එකිනෙකට වෙනස් ක්‍රමවේද දක්වා ඇත. තම

රටවල වෙළඳ බැඳීම් ක්‍රියාත්මක කිරීමත් ඒ සම්බන්ධයෙන් A, B සහ C යන වර්ගීකරණ යටතේ ලෝක වෙළඳ සංවිධානය වෙත දැනුම් දීමත් සිදු කළ යුතු දිනය තීරණය කිරීම සඳහා සංවර්ධනය වෙමින් පවතින සියලු රටවලට ඉඩ සැලසේ.

**තෙවන කොටස -** මෙමගින් ගිවිසුමෙහි පරිච්ඡේද 02 ක් ආවරණය කරනු ලබන අතර ලෝක වෙළඳ සංවිධානය තුළ ක්‍රියාත්මක වන වෙළඳ පිළිබඳ ස්ථාවර කමිටුවත්, ලෝක වෙළඳ සංවිධානයට අයත් සාමාජික රටවල් විසින් වෙළඳ ගිවිසුම් පිළිබඳව දේශීය සම්බන්ධීකරණයත් තම රටවල් තුළ එම වෙළඳ ගිවිසුම් ක්‍රියාවට නැංවීමත් සඳහා පහසුකම් සැලසීම සඳහා ස්ථාපිත කරගත් ජාතික කමිටු පිහිටුවා ගැනීම පිළිබඳ විධි විධාන මීට ඇතුළත් වේ.

ශ්‍රී ලංකාව, ලෝක වෙළඳ සංවිධානයෙහි A, B සහ C කාණ්ඩ යටතේ සිය වෙළඳ පහසුකරණ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන සැකසීමේ කටයුතු අවසන් කොට ඇති අතර, එය දැනටමත් ලෝක වෙළඳ සංවිධානය වෙත භාරදී ඇත. ගිවිසුම බලාත්මක කරනු ලබන විට සාමාජික රට විසින් ක්‍රියාවට නංවනු ලබන විධිවිධාන A කාණ්ඩයට ඇතුළත් වේ. B කාණ්ඩයට අයත් වන්නේ ගිවිසුම බලාත්මක කළ පසු එය ක්‍රියාවට නැංවීමෙන් අනතුරුව සාමාජික රට විසින් ක්‍රියාවට නංවනු ලබන විධිවිධානයන්ය. ගිවිසුම බලාත්මක වීමෙන් පසුව සහ එය ක්‍රියාවට නැංවීමෙන් මද කලකට පසු දිනයක සාමාජික රට විසින් ක්‍රියාත්මක කරනු ලබන සහ ශක්‍යතාව ගොඩනැංවීම සම්බන්ධයෙන් සහාය ලබා ගත යුතු විධිවිධාන C කාණ්ඩයට ඇතුළත් වේ. වෙළඳ පහසුකරණ ගිවිසුමෙහි B සහ C කාණ්ඩ යටතේ ශ්‍රී ලංකාවේ වෙළඳ බැඳීම් ක්‍රියාවට නැංවීම සඳහා තාක්ෂණික සහාය සහ ශක්‍යතා වර්ධනය කිරීමේ සහාය ලෝක බැංකු කණ්ඩායම සහ ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය මඟින් පිරිනැමේ.

ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳ පහසුකරණ ගිවිසුමෙහි 23.2 වගන්තිය යටතේ, මඟින් ශ්‍රී ලංකාවට අදාළ වන බැඳීම් ක්‍රියාවට නැංවීම සඳහා දේශීය සම්බන්ධීකරණය ඇති කිරීම වෙනුවෙන් 2016 වසරේදී ජාතික වෙළඳ පහසුකරණ කමිටුව(NTFC) ස්ථාපිත කරන ලදී.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ සභාපතිත්වයෙන්ද, ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ සම සභාපතිත්වයෙන්ද සැදුම්ලත් ජාතික වෙළඳ පහසුකරණ කමිටුව රාජ්‍ය අංශය දේශසීමා නියාමනය සහ පෞද්ගලික අංශය නියෝජනය කරනු ලබන සමාජිකයන් 23 දෙනෙකුගෙන් සමන්විත කමිටුවකි. (රාජ්‍ය ආයතන නියෝජනය කරනු ලබන සාමාජිකයන් 16 ක් සහ පෞද්ගලික අංශය නියෝජනය කරනු ලබන සාමාජිකයන් 07 ක්)

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය නියෝජනය කරමින්, එහි වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ ජාතික වෙළඳ පහසුකරණ කමිටුවට ඇතුළත් වේ. ශ්‍රී ලංකාව තුළ වෙළඳ පහසුකරණය පිළිබඳ සම්බන්ධීකරණය සහ එය ක්‍රියාවට නැංවිම මෙන්ම වෙනත් ආකාර වෙළඳ පහසුකරණ ක්‍රියාකාරකම්වල සඵලදායක බව සහතික කිරීම සඳහා ලෝක බැංකු කණ්ඩායම් සහාය / ආධාර ඇතිව, ජාතික වෙළඳ පහසුකරණ කමිටුව සඳහා ලේකම් කාර්යාලයක්ද ස්ථාපිත කොට ඇත.

ජාතික වෙළඳ පහසුකරණ කමිටුවෙහි ලේකම් කාර්යාලය විසින් අදාළ සියලුම දේශ සීමා නියාමන නියෝජිත ආයතනවල සහාය ඇතිව, වෙළඳ පහසුකරණ ගිවිසුම සඳහා සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් සකස්

කරන ලදී. මෙම ක්‍රියාකාරී සැලසුමෙහි කාලය වසර 05ක් සඳහාය (2018 - 2022). වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව මෙම ක්‍රියාකාරී සැලසුම යටතේ පවරනු ලැබූ කාර්යයන් මේ වනවිටත් සම්පූර්ණ කොට ඇත.

ජාතික තනි කවුළුව (National Single Window) සහ වෙළඳ තොරතුරු ද්වාරය (Trade Information Portal – TIP) වශයෙන් වෙළඳ පහසුකරණ ගිවිසුමෙහි මූලික ප්‍රමුඛතා දෙකකි. 2018 වර්ෂයේ ජූලි මස ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය යනු ලංකාවේ ආනයන අපනයන පිළිබඳ සියළු තොරතුරු සඳහා ඒකීය නැවතුම්පොල දත්ත පද්ධතියකි. මුදල් අමාත්‍යාංශය ඇතුළු ශ්‍රී ලංකාවේ ආනයන අපනයන ක්‍රියාවලිය හා සම්බන්ධ සියලුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වෙනුවෙන් වාණිජ දෙපාර්තමේන්තුව විසින් මෙම දත්ත පද්ධතිය නඩත්තු කරනු ලබයි.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි www.treasury.gov.lk, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවට අයත් www.customs.gov.lk සහ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට අයත් www.documents.gov.lk යන වෙබ් අඩවිවල පළකොට ඇති යාවත්කාලීන කරන ලද තීරුබදු / බදු පිළිබඳව සවිස්තරාත්මක තොරතුරු ඉහත සඳහන් වෙළඳ තොරතුරු ද්වාරය ඔස්සේ ලබා ගත හැකිය.

## 2.5 ආනයන තීරුබදු ව්‍යුහය

**2.14 වගුව - 2019 දෙසැම්බර් 31 වැනි දිනට තීරු බදු ව්‍යුහය**

| අනු අංකය | තීරුබදු අනුපාතය | තීරුබදු සංකේතාංක සංඛ්‍යාව (සංයෝජිත වර්ගීකරණය 2017 - සංඛ්‍යාංක 08 ක් වන ) | ප්‍රතිශතය % |
|---|---|---|---|
| 1 | නිදහස් | 4,099 | 54.67 |
| 2 | 5% | 2 | 0.03 |
| 3 | 10% | 9 | 0.12 |
| 4 | 15% | 1,537 | 20.50 |
| 5 | 25% | 25 | 0.33 |
| 6 | 30% | 1,462 | 19.50 |
| 7 | 125% | 5 | 0.07 |
| 8 | විශේෂිත අනුපාත | 73 | 0.97 |
| 9 | විශේෂිත අනුපාත සහ වටිනාකම මත අය කරන ලද අනුපාත | 287 | 3.83 |
| | එකතුව | 7,499 | 100 |

මූලාශ්‍රය - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2019

**2.15 වගුව - 2011 සිට 2019 දක්වා තීරු බදු ව්‍යුහයේ වෙනස්කම්**

| අංකය | තීරුබදු කාණ්ඩය | තීරුබදු සංකේතාංක (සංඛ්‍යාංක 08) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | **2019** | **2018** | **2017** | **2016** | **2015** | **2014** | **2013** | **2012** |
| 1 | නිදහස් | 4,099 | 4,064 | 4,064 | 3,938 | 3,922 | 3,379 | 3,379 | 3,024 |
| 2 | 5% | 2 | 2 | 2 | | | | | 410 |
| 3 | 7.5% | | | | | 188 | 184 | | |
| 4 | 10% | 9 | 9 | 9 | | | | | |
| 5 | 15% | 1,537 | 1,542 | 1,534 | 1,309 | 1,324 | 1,601 | 1,590 | 1,587 |
| 6 | 25% | 25 | 25 | 25 | | | 1,415 | 1415 | |
| 7 | 30% | 1,462 | 1,459 | 1,454 | 1,430 | 1,457 | | | 1,504 |
| 8 | සුඛෝපභෝගී අනුපාත | 5 | 8 | 9 | 9 | 9 | 9 | 9 | 9 |
| 9 | විශේෂ අනුපාත / ඒකක අනුපාත | 73 | 76 | 72 | 65 | 67 | 84 | 84 | 84 |
| 10 | විශේෂිත අනුපාත සහ වටිනාකම මත අය කරන ලද අනුපාත | 287 | 275 | 269 | 255 | 186 | 184 | 183 | 200 |
| **එකතුව** | | **7,499** | **7,460** | **7,438** | **7,042** | **6,965** | **6,926** | **6,844** | **6,818** |

මූලාශ්‍රය - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2019

### 2.5.1. 2019 වසරේදී සංයෝජිත වර්ගීකරණ පද්ධතියට අලුතින් එකතු කරන ලද ජාතික උප බෙදීම් සංකේතාංක

වෙළඳාම, ආයෝජන සහ කර්මාන්ත සඳහා පහසුකම් සැලසීමට 2019 වසරේදී පහත වගුවේ දැක්වෙන පරිදි නව ජාතික උප බෙදීම් සංකේතාංක 55 ක් දේශීය වශයෙන් සකස් කරන ලදී.

**2.16** වගුව - **2019** වර්ෂයේදී සංයෝජිත වර්ගීකරණ පද්ධතියට ඇතුළත් කරන ලද නව ජාතික උප බෙදීම්

| අංකය | සංයෝජිත වර්ගීකරණ සංකේතාංක | විස්තරය |
|---|---|---|
| 1 | 07133122 | පියළි කළ උඳු |
| 2 | 21069032 | පානයන් නිෂ්පාදනය කිරීම සඳහා ගන්නා මධ්‍යසාර අන්තර්ගත නොවන මිශ්‍රණ |
| 3 | 21069050 | මොනෝ සෝඩියම් ග්ලූටමේට් අඩංගු මිශ්‍රණ වර්ධනය කරන රස |
| 4 | 29033911 | ට්‍රිෆ්ලුවොරොමීතේන් (HFC – 32) |
| 5 | 29033912 | ඩිෆ්ලුවොරොමීතේන් (HFC – 32) |
| 6 | 29033913 | ෆ්ලුවොරොමීතේන් (HFC – 41), 1,2 ඩිෆ්ලුවොරොඊතේන් (HFC – 152) සහ 1,1 ඩිෆ්ලුවොරොඊතේන් (HFC – 152 අ) |
| 7 | 29033914 | පෙන්ටෆ්ලුවොරොඊතේන් (HFC – 125), 1,1,1, ට්‍රිෆ්ලුවොරොඊතේන් (HFC – 143 සහ 1,1,2 ට්‍රිෆ්ලුවොරොඊතේන් (HFC – 143) |
| 8 | 29033915 | 1,1,1,2- ටෙට්‍රාෆ්ලුවොරොඊතේන් (HFC – 134 a) සහ 1,1,1,2- ටෙට්‍රාෆ්ලුවොරොඊතේන් (HFC – 134) |
| 9 | 29033916 | 1,1,1,2,3,3,3- හෙප්ටාෆ්ලුවොරොප්‍රොපේන් (HFC – 227 a), 1,1,2,2,3,- හෙක්සාෆ්ලුවොරොප්‍රොපේන් (HFC – 36 cb), පෙන්ටාෆ්ලුවොරොප්‍රොපේන් (HFC – 227 අ),1,1,2,2,3,- හෙක්සාෆ්ලුවොරොප්‍රොපේන් (HFC – 236 ea), සහ 1,1,1,3,3,3- හෙක්සාෆ්ලුවොරොප්‍රොපේන් (HFC – 236 fa), |
| 10 | 29033917 | 1,1,13,3 පෙන්ටාෆ්ලුවොරොප්‍රොපේන් (HFC – 245 fa), සහ 1,1,2,2,3 පෙන්ටාෆ්ලුවොරොප්‍රොපේන් (HFC – 245 ca) |
| 11 | 29033918 | 1,1,13,3 පෙන්ටාෆ්ලුවොරොබියුටේන් (HFC – 365 mfca) සහ1,1,1,1,2,2,3,4,5,5,5-ඩෙකාෆ්ලුවොරොපෙන්ටේන් (HFC – 43 mee) |
| 12 | 29033919 | වෙනත් |
| 13 | 29033921 | (Z) 1,1,1,4,4,4- හෙක්සාෆ්ලුවොරො -2-බියුටේන් (HFC – 1336 mzz) |
| 14 | 29033929 | 2,3,3,3 -ටෙට්‍රාෆ්ලුවොරොප්‍රොපේන් (HFO – 1234 yf),<br>1,3,3,3 -ටෙට්‍රාෆ්ලුවොරොප්‍රොපේන් (HFO – 1234 ze), සහ<br>(Z) 1,1,1,4,4,4- හෙක්සාෆ්ලුවොරො -2-බියුටේන් (HFC – 1336 mzz) |
| 15 | 29033931 | මෙතිල් බෝර්මයිඩ් (බ්‍රොමමීතේන්) |
| 16 | 29033939 | වෙනත් |
| 17 | 34011120 | (තෙත) පිසදමන කඩදාසි |
| 18 | 34011130 | 500g හෝ ඊට අඩු සිල්ලර ඇසුරුම |
| 19 | 38247410 | (තෙත) පිසදමන කඩදාසි |
| 20 | 34011920 | 500g හෝ ඊට අඩු සිල්ලර ඇසුරුම |

| | | |
|---|---|---|
| 21 | 38247410 | මීතෙන් සන්තෘප්ත කොටස්<br>(F=1ට3) ඊතෙන් (F=2ට5) සහ ප්‍රොපේන් (F=5ට7)<br>1,1,13,3 පෙන්ටාෆලූ්‍යුරොබ්‍යුටේන් (HFC – 365 mfca)<br>සහ1,1,1,1,2,2,3,4,5,5,5- ඩෙකාෆලූ්‍යුරොපෙන්ටේන් (HFC – 43 mee) |
| 22 | 38247420 | උප ශීර්ෂ 2903.7 සිට 2903.75 දක්වා ද්‍රව්‍ය ඇතුළත් වෙනත් |
| 23 | 38247490 | වෙනත් |
| 24 | 38247811 | ට්‍රිෆලූ්‍යුරොමීතෙන් අඩංගු (HFC – 23) |
| 25 | 38247819 | වෙනත් |
| 26 | 38247821 | ස්කන්ධයෙන් 15% ට වැඩිපුර අඩංගු |
| 27 | 38247822 | ඉහත උප ශීර්ෂවල ඇතුළත් නොවන ස්කන්ධයෙන් 55% ක් හෝ ඊට වැඩි පෙන්ටාෆලූ්‍යුවොරතේන් (HFC – 125) අඩංගු එහෙත්, අසන්තෘප්ත ඇක්‍රලික් කොටස් අන්තර්ගත නොවන හයිඩ්‍රොකාබන් (HFOs) |
| 28 | 38247823 | ඉහත උප ශීර්ෂවල ඇතුළත් නොවන ස්කන්ධයෙන් 40% ක් හෝ ඊට වැඩි පෙන්ටාෆලූ්‍යුවොරතේන් (HFC – 125) අඩංගු වෙනත්) |
| 29 | 38247824 | ඉහත උප ශීර්ෂවල ඇතුළත් නොවන ස්කන්ධයෙන් 30% ක් හෝ ඊට වැඩි 1,1,1,2- ටෙට්රාෆලූ්‍යුවොරතේන් (HFC – 125) අඩංගු එහෙත්, අසන්තෘප්ත ඇක්‍රලික් කොටස් අන්තර්ගත නොවන හයිඩ්‍රොකාබන් (HFOs) |
| 30 | 38247825 | ඉහත උප ශීර්ෂවල ඇතුළත් නොවන වෙනත් |
| 31 | 382474826 | ඉහත උප ශීර්ෂවල ඇතුළත් නොවන සන්තෘප්ත මීතෙන් කොටස් අඩංග වන (F=1ට3) ඊතෙන් (F=2ට5) සහ ප්‍රොපේන් (F=5ට7)<br>1,1,1,1,2,2,3,4,5,5,5- ඩෙකාෆලූ්‍යුරොපෙන්ටේන් (HFC – 43 mee) |
| 32 | 65050090 | වෙනත් |
| 33 | 40111010 | ළමා කරත්ත සඳහා භාවිත කරන අගල් 5 රෝද පට්ටම |
| 34 | 40111090 | වෙනත් |
| 35 | 49021011 | අශ්ව රේස්, ග්‍රේ හවුන්ඩ් සුනඛ රේස් ආදියෙහි තොරතුරු ඇතුළත් ප්‍රකාශන |
| 36 | 49021019 | වෙනත් |
| 37 | 49021091 | අශ්ව රේස්, ග්‍රේ හවුන්ඩ් සුනඛ රේස් ආදියෙහි තොරතුරු ඇතුළත් ප්‍රකාශන |
| 38 | 49021099 | වෙනත් |
| 39 | 49029011 | අශ්ව රේස්, ග්‍රේ හවුන්ඩ් සුනඛ රේස් ආදියෙහි තොරතුරු ඇතුළත් ප්‍රකාශන |
| 40 | 49029019 | වෙනත් |
| 41 | 49029091 | අශ්ව රේස්, ග්‍රේ හවුන්ඩ් සුනඛ රේස් ආදියෙහි තොරතුරු ඇතුළත් ප්‍රකාශන |
| 42 | 49029099 | වෙනත් |
| 43 | 72179090 | ප්ලාස්ටික් පුවරුව හෝ ආවරණය සහිත |
| 44 | 72179090 | වෙනත් |
| 45 | 84509010 | කොටස් |

| | | |
|---|---|---|
| 46 | 84509090 | කොටස් |
| 47 | 87049031 | ධාරිතාවය කි.වො. 50 ට නොවැඩි මෝටර |
| 48 | 87049032 | ධාරිතාවය කි.වො. 50 ට වැඩි එහෙත් කි.වො. 100 ට නොවැඩි මෝටර |
| 49 | 87049033 | ධාරිතාවය කි.වො. 50 ට වැඩි එහෙත් කි.වො. 200 ට නොවැඩි මෝටර |
| 50 | 87049034 | ධාරිතාවය කි.වො. 200 ට නොවැඩි මෝටර |
| 51 | 87049041 | ධාරිතාවය කි.වො. 50 ට නොවැඩි මෝටර |
| 52 | 87049042 | ධාරිතාවය කි.වො. 50 ට වැඩි එහෙත් කි.වො. 100 ට නොවැඩි මෝටර |
| 53 | 87049044 | ධාරිතාවය කි.වො. 50 ට වැඩි එහෙත් කි.වො. 200 ට නොවැඩි මෝටර |
| 54 | 87049044 | ධාරිතාවය කි.වො. 200 ට නොවැඩි මෝටර |
| 55 | 87089190 | වෙනත් |

මූලාශ්‍රය - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව ,2019

### 2.5.2 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ ආඥා පනත යටතේ සිදුකළ සංශෝධන

1962 අංක 19 දරණ ආදායම් සංරක්ෂණ පනත යටතේ පළ කරන ලද ආදායම් සංරක්ෂණ ආඥා නියෝග පිළිබඳ විස්තර පහත දැක්වෙන වගුවෙහි සඳහන් කර ඇත. වෙළඳාම සහ කර්මාන්ත සඳහා පහසුකම් සැලසීම සඳහා 2019 වසරේදී එවැනි ආඥා නියෝගයන් 04 ක් නිකුත් කර ඇත.

**2.17** වගුව **- 1962** අංක **19** දරන ආදායම් සංරක්ෂණ ආඥා පනත *(රේගු තීරු බදු වෙනස්වීම්)*

| අංකය | ආදායම් සංරක්ෂණ ආඥාව පිළිබඳ විස්තර | ගැසට් පත්‍රයේ දිනය සහ අංකය | බලාත්මක කරන ලද දිනය | විස්තරය |
|---|---|---|---|---|
| 1 | RPO/01/2019 | 2113/2 – 2019.03.05 | 2019.03.06 | 2019 අයවැය යෝජනා අනුව, 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණය කිරීමේ ආඥා පනත යටතේ පහත දැක්වෙන ආනයන තීරුබදු ප්‍රතිශෝධන සිදු කොට 2019 මාර්තු 05 වැනි දිනැති අංක 2113/2 දරන ගැසට් නිවේදනය මගින් ක්‍රියාත්මක කරන ලදී.<br>1. 2019 අයවැය යෝජනා මගින් පහත දැක්වෙන අයිතම සඳහා ආනයන තීරුබදු ප්‍රතිශත සංශෝධනය (සංයෝජිත වර්ගීකරණ කේත 14)<br><br>වෙනස් කොට සැකසූ එතිල් ඇල්කොහොල්<br>ටයර් ටියුබ<br>ජල පෙරණ<br>ළමා කරත්ත<br><br>2. දේශීය කර්මාන්ත වලට සහාය වීමේ හා ආදායම් උත්පාදනය කිරීමේ අරමුණින් බදු විෂමතා ඉවත් කිරීම සඳහා නව සංයෝජිත වර්ගීකරණ සකස් කිරීම (සංයෝජිත වර්ගීකරණ කේත 55) .<br>3. අමතර ආදායම් උත්පාදනය කිරීමේ අමුණින්, තෝරාගත් භාණ්ඩ (සංයෝජිත වර්ගීකරණ කේත 261) ක් සඳහා ආනයන තීරුබදු ඒකකයක ප්‍රතිශතය 10% කින් ඉහළ දමා ඇත. |
| 2 | RPO/02/2019 | 2127/13 – 2019.06.11 | 2019.06.12 | ඉන්ධන මිල සූත්‍රය ක්‍රියාවට නැංවීම සඳහා සහාය වීමට සුපර් ඩීසල් සහ වෙනත් ඩීසල් සඳහා (සංයෝජිත වර්ගීකරණ කේත 2710.19.41 සහ 2710.19.49 ) ආනයන තීරුබද්ද ලීටරයට රු.10.55 සිට රු.15 දක්වා ඉහළ නංවන ලදී. |

| | | | | |
|---|---|---|---|---|
| 3 | RPO/03/2019 | 2140/19 – 2019.09.10 | 2019.09.11 | උඳු (පියළි කළ) සහ (සම්පූර්ණ) යන දෙවර්ගය වශයෙන් හඳුනාගැනීම සඳහා සඳහා වෙන් වෙන් වශයෙන් නව සංයෝජිත වර්ගීකරණ කේත හඳුන්වා දෙන ලදී . |
| 4 | RPO/04/2019 | 2142/87 - 2019.09.27 | 2019.09.28 | 2019 අයවැය යෝජනා පරිදි, ආනයනය කරන ලද පළතුරු බීම සඳහා තීරුබදු සංශෝධනය කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව, මෙම ගැසට් නිවේදනය මගින් තෝරාගත් පළතුරු බීම වර්ග සඳහා විශේෂිත අනුපාත මත අයකරන බදුවලට අමතරව විශේෂිත තීරු බදු ප්‍රතිශත (ඒකක ප්‍රතිශත) හඳුන්වා දෙන ලදී. |

මූලාශ්‍රය - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව - 2019

### 2.5.3 2007 අංක 48 දරණ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත

2007 අංක 48 දරණ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නෛතික ප්‍රතිපාදන මත ගැසට් නිවේදනයක් පළ කිරීම මගින් බදු අය කිරීම සඳහා වූ තනි සංයුතියකින් යුතු විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත 2018 වසරේදී ද තෝරාගත් ආනයන භාණ්ඩ කිහිපයක් සම්බන්ධයෙන් පනවා ඇත (උදා -අර්තාපල්, රතුළූණු සහ බී ළූණු වැනි). දේශීය ගොවියා සඳහා පහසුකම් සපයන අතර පාරිභෝගිකයින් සඳහා දැරිය හැකි මිළක් පවත්වාගෙන යාම සඳහා විධිමත් සංශෝධන මෙම පනත යටතේ සිදු කර ඇත. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ අරමුණු ප්‍රවර්ධනය කිරීම සඳහා 2019 වසර තුළදී පහත වගුවෙහි දැක්වෙන පරිදි නියෝග 26ක් නිකුත් කොට ඇත.

**2.18 වගුව - 2007 අංක 48 දරණ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ සිදුකරන ලද බදු සංශෝධන**

| අංකය | ගැසට් අංකය හා දිනය | බලාත්මක දිනය | අයිතමය | පැවති බද්ද කිලෝ ග්‍රෑමයට රු. | නව බද්ද කිලෝ ග්‍රෑමයට රු. | විස්තරය |
|---|---|---|---|---|---|---|
| 1 | 2104/30 2019.01.03 | 2019.01.04 | උඳු | 125/= | 200/= | ජනවාරි මාසයේ සිට අස්වැන්න වෙළඳපොළ වෙත ලැබෙන බැවින්, දේශීය ගොවියට |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | සුරක්ෂිත මිලක් ලබා දීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිර්දේශ මත, මාස 06ක කාලයක් සඳහා බල පැවැත්වෙන පරිදි ආනයනය කරනු ලබන උඳු කිලෝග්‍රෑමයක් සඳහා තීරු බද්ද රු. 75/- කින් ඉහළ නංවන ලදී. |
| 2 | 2108/65<br>2019.02.01 | 2019.02.02 | කඩල<br>පරිප්පු<br>සීනි | සම්පූර්ණ 2/=<br>පියළි කළ 5/=<br>සම්පූර්ණ 2/=<br>පියළි කළ 7/=<br>සුදු සීනි 32/=<br>දුඹුරු සීනි 35/= | වෙනසක් නොමැත | මිල ස්ථාවරත්වය තුළින් පාරිභෝගිකයන්ට සහන සැලසීම සඳහා මෙම භාණ්ඩ බද්දෙහි වලංගු කාල සීමාව මාස 6 ක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී |
| 3 | 2109/15<br>2019.02.07 | 2019.02.08 | අර්තාපල් | 20/= | 50/= | කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිර්දේශ මත 2019.02.05 වැනි දින පැවති ජීවන වියදම් කමිටුවේ නිර්දේශය මත, දේශීය ගොවියාට සුරක්ෂිත මිලක් ලබා දීම සඳහා අර්තාපල් ආනයනය මත පැවති තීරු බද්ද මාස 03 ක කාලයක් සඳහා කිලෝ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | ග්‍රෑමයට රු.30/= කින් ඉහළ දමන ලදී |
| 4 | 2019/20<br>2019.02.08 | 2019.02.09 | ඉරිඟු | 10/= | 20/= | අස්වැන්න වෙළඳපොළ වෙත ලැබෙන බැවින්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිර්දේශ මත 2019.02.05 වැනි දින පැවති ජීවන වියදම් කමිටුවේ නිර්දේශය මත, ඉරිඟු අනයන තීරු බද්ද මාස 06 ක කාලයක් සඳහා රු.10/= කින් ඉහළ දමන ලදී |
| 5 | 2111/58<br>2019.02.24 | 2019.02.25 | එළවළු තෙල් | පිරිසුදු නොකළ 150/=<br>පිරිසුදු කළ 170/=<br>පාම් ඔලේන් 155/=<br>පොල් තෙල් 170/= | වෙනසක් නොමැත | පොල් නිෂ්පාදනවල ස්ථාවරත්වය, ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ එළවළු තෙල් මිල සහ දේශීය වෙළෙඳපොළ මිල ස්ථාවරත්වය සැලකිල්ලට ගනිමින් ජීවන වියදම් කමිටුවෙහි නිර්දේශ මත එළවළු තෙල් අනයනය සඳහා පවත්නා බදු අනුපාත වලංගු කාල සීමාව දීර්ඝ කරන ලදී. |
| 6 | 2112/48<br>2019.03.02 | 2019.03.02 | බී ළූණු | 20/= | වෙනසක් නොමැත | ජීවන වියදම් කමිටුවෙහි නිර්දේශ මත මිල ස්ථාවරත්වය තුළින් පාරිභෝගිකයන්ට සහන සැලසීම සඳහා මෙම භාණ්ඩ බද්දෙහි වලංගු කාල සීමාව තවත් මාස 3 ක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 7 | 2122/4<br>2019.05.07 | 2019.05.08 | හාල්මැස්සන්<br>කරවල<br>අර්තාපල්<br>මුං ඇට<br>මැංගුස්ටීන්<br>වියලි දොඩම්<br>පෙයාර්ස්<br>චෙරි<br>ප්ලම්ස්<br>කිවිෆෘට්<br>වෙනත් පළතුරු | 1/=<br>52/=<br>50/=<br>40/=<br>200/=<br>200/=<br>175/=<br>250/=<br>200/=<br>175/=<br>200/= | වෙනසක් නොමැත | පාරිභෝගිකයන්ට සහන සැලසීම සඳහා මෙම භාණ්ඩ සඳහා පැවති තීරු බද්දෙහි වලංගු කාල සීමාව මාස 6 ක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |
| 8 | 2124/2<br>2019.05.21 | 2019.05.21 | රතු ළූණු<br>රට ඉඳි<br>වියළි මිදි<br>සූදුරු<br>මහදුරු<br>මාගරින් (මේදය 80% ට වැඩි)<br>මාගරින් (වෙනත්)<br>කවුපි (පියළි කළ)<br>කවුපි (සම්පූර්ණ) | 25/=<br>60/=<br>230/=<br>162/=<br>162/=<br>215/=<br>315/=<br>5/=<br>8/= | | පාරිභෝගිකයන්ට සහන සැලසීම සඳහා මෙම භාණ්ඩ සඳහා පැවති තීරු බද්දෙහි වලංගු කාල සීමාව වසරක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |
| 9 | 2124/4<br>2019.05.21 | 2019.05.22 | බී ළූණු | 20/= | 40/= | දේශීය ගොවියා ආරක්ෂා කරගැනීම සඳහා බී ළූණු සඳහා පැවති ආනයන තීරු බද්ද ඉහළ දමන ලදී. |
| 10 | 2130/20<br>2019.07.03 | 2019.07.04 | උඳු | 200/= | වෙනසක් නොමැත | දේශීය ගොවියා ආරක්ෂා කරගැනීම සඳහා උඳු සඳහා පැවති ආනයන තීරු බද්ද වසරකින් දීර්ඝ කරන ලදී. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 11 | 2131/30<br>2019.07.10 | 2019.07.11 | එළවළු තෙල්<br><br><br><br><br><br><br><br>රට ඉඳි<br>දොඩම්<br>ඇපල් | පිරිසුදු නොකළ<br>150/=<br>පිරිසුදු කළ<br>170/=<br>පාම් ඔලේන්<br>155/=<br>පොල් තෙල්<br>170/=<br><br>60/=<br>65/=<br>45/= | පිරිසුදු නොකළ<br>175/=<br>පිරිසුදු කළ<br>195/=<br>පාම් ඔලේන්<br>180/=<br>පොල් තෙල්<br>195/=<br><br>80/=<br>80/=<br>60/= | දේශීය වෙළඳපොළෙහි පොල් මිල පහළ යෑම සහ දේශීය ගොවීන් ආරක්ෂා කිරීම සැලකිල්ලට ගෙන එළවළු තෙල් සඳහා තීරු බදු ඉහළ නංවන ලදී. රජයේ ආදායම ඉහළ නැංවීමේ අරමුණින් ඇපල්, දොඩම් සහ රට ඉඳි ආනයන තීරු බදු ඉහළ නංවන ලදී. |
| 12 | 2132/13<br>2019.07.18 | 2019.07.19 | උම්බලකඩ<br>වීස්<br>මිරිස්<br>කොත්තමල්ලි<br>කහ<br>උඳු<br>තිරිඟු පිටි<br>ටින් මාළු | 102/=<br>200/=<br>25/=,125<br>26/=,52/=<br>102/=,360<br>200/=<br>50/= | | පාරිභෝගිකයන්ට ස්ථාවර වෙළඳපොළ මිලක් ලබා දීම සැලසීම සඳහා මෙම භාණ්ඩ සඳහා පැවති තීරු බද්දෙහි වලංගු කාල සීමාව වසරක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |
| 13 | 2134/44<br>2019.08.01 | 2019.08.02 | කඩල<br><br><br><br><br>පරිප්පු | සම්පූර්ණ<br>2/=<br>පියළි කළ<br>5/=<br><br>සම්පූර්ණ<br>2/=<br>පියළි කළ<br>7/=<br><br>සුදු සීනි | වෙනසක් නොමැත | පාරිභෝගිකයන්ට ස්ථාවර වෙළඳපොළ මිලක් ලබා දීම සැලසීම. සඳහා මෙම භාණ්ඩ සඳහා පැවති තීරු බද්දෙහි වලංගු කාල සීමාව මාස 06 ක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | සීනි | 32/=<br>දුඹුරු සීනි<br>35/= | | |
| 14 | 2135/54<br>2019.08.08 | 2019.08.09 | ඉරිඟු | 20/= | 10/= | ජීවන වියදම් කමිටුවෙහි නිර්දේශ මත සත්ත්ව ආහාර සඳහා ප්‍රමාණවත් වීම සඳහා බඩ ඉරිඟු සඳහා පැවති ආනයන තීරු බද්ද රු.10 කින් පහළ දමන ලදී. |
| 15 | 2135/67<br>2019.08.10 | 2019.08.11 | එළවළු තෙල්<br><br><br><br><br><br><br><br><br><br>රට ඉඳි<br>දොඩම්<br>ඇපල් | පිරිසුදු නොකළ<br>150/=<br>පිරිසුදු කළ<br>170/=<br>පාම් ඔලේන්<br>155/=<br>පොල් තෙල්<br>170/=<br><br>60/=<br>65/=<br>45/= | පිරිසුදු නොකළ<br>175/=<br>පිරිසුදු කළ<br>195/=<br>පාම් ඔලේන්<br>180/=<br>පොල් තෙල්<br>195/=<br><br>80/=<br>80/=<br>60/= | දේශීය වෙළඳපොළෙහි පොල් මිල පහළ යෑම සහ දේශීය ගොවීන් ආරක්ෂා කිරීම සැලකිල්ලට ගෙන එළවළු තෙල් සඳහා තීරු බදු වලංගු කාල සීමාව මාස 03 කින් දීර්ඝ කරන ලදී. රජයේ ආදායම ඉහළ නැංවීමේ අරමුණින් ඇපල්, දොඩම් සහ රට ඉඳි ආනයන තීරු බදු ඉහළ නංවන ලදී. |
| 16 | 2139/74<br>2019.09.07 | 2019.09.08 | මැකරල් මාළු<br>කවුපි<br>කුරක්කන්<br>මෙනේරි | 6/=<br>70/=<br>70/= | වෙනසක් නොමැත | තීරු බදු වලංගු කාල සීමාව මාස 06 ක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |
| 17 | 2140/20<br>2019.09.10 | 2019.09.11 | උඳු | 200/= | සම්පූර්ණ<br>200/=<br>පියළි කළ<br>300/= | ආනයනය කරන ලද පියළි කළ උඳු සඳහා කිලෝග්‍රෑමයට රු. 300/- ක නව තීරු බද්දක් පනවන ලදී. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 18 | 2143/3<br>2019.09.30 | 2019.10.01 | මාළු<br>යෝගට්<br>බටර්<br>සුදුළූණු<br>දොඩම්<br>මිදි<br>ඇපල්<br>උළුහාල්<br>කුරක්කන්<br>රටකජු<br>අබ ඇට<br>ලූණු | කිලෝවට<br>10 % හෝ<br>රු.100/=<br>625/=<br>880/=<br>40/=<br>65/=<br>130/=<br>45/=<br>50/=<br>150/=<br>112/=<br>62/=<br>40/= | | තීරු බදු වලංගු කාල සීමාව වසරක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |
| 19 | 2143/21<br>2019.10.02 | 2019.10.03 | බී ළූණු | 40/= | 39/= | පාරිභෝගිකයන්ට සාධාරණ මිලක් ලබා දීම සඳහා දින බී ළූණු සඳහා පැවති ආනයන තීරු බද්ද දින 31 ක කාලයක් සඳහා රු 1/= කින් පහළ දමන ලදී. |
| 20 | 2147/5<br>2019.10.28 | 2019.10.29 | බී ළූණු<br><br>කුඩු නොකරන ලද මිරිස් | කිලෝවට<br>10 % හෝ<br>100/=<br>25/= | 25/=<br>5/= | වෙළඳපොළ මිල සහ ජීවන වියදම් කමිටුවෙහි නිර්දේශ සැලකිල්ලට ගනිමින් විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතෙහි 05 වැනි වගන්තිය යටතේ තීරු බදු ඉවත් කිරීම සිදු කරන ලදී. |
| 21 | 2147/74<br>2019.11.01 | 2019.11.03 | බී ළූණු | 1/= | වෙනසක් නොමැත | තීරු බදු වලංගු කාල සීමාව මාස 03 ක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |
| 22 | 2148/25 | 2019.11.08 | හාල්මැස්සන් | | | පාරිභෝගිකයන්ට |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2019.11.07 | | කරවල<br>අර්තාපල්<br>මුං ඇට<br>මැංගුස්ටින්<br>වියලි දොඩම්<br>පෙයාර්ස්<br>චෙරි<br>ප්ලම්ස්<br>කිවිෆෲට්<br>වෙනත්<br>පළතුරු | 1/=<br>52/=<br>50/=<br>40/=<br>200/=<br>200/=<br>175/=<br>250/=<br>200/=<br>175/=<br>200/= | වෙනසක් නොමැත | ස්ථාවර වෙළඳපොළ මිලක් ලබා දීම සැලසීම සඳහා මෙම භාණ්ඩ සඳහා පැවති තීරු බද්දෙහි වලංගු කාල සීමාව මාස 06 ක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |
| 23 | 2148/37<br>2019.11.08 | 2019.11.11 | එළවළු තෙල්<br><br><br><br><br>රට ඉඳි<br>දොඩම්<br>ඇපල් | පිරිසුදු නොකළ 150/=<br>පිරිසුදු කළ 195/=<br>පාම් ඔලේන් 180/=<br>පොල් තෙල් 195/=<br><br>80/=<br>80/=<br>60/= | වෙනසක් නොමැත | දේශීය වෙළඳපොළෙහි පොල් මිල පහළ යෑම සහ දේශීය ගොවීන් ආරක්ෂා කිරීම සැලකිල්ලට ගෙන එළවළු තෙල් සඳහා තීරු බදු වලංගු කාල සීමාව මාස 03 කින් දීර්ඝ කරන ලදී. රජයේ ආදායම ඉහළ නැංවීමේ අරමුණින් ඇපල්, දොඩම් සහ රට ඉඳි ආනයන තීරු බදු ඉහළ නංවන ලදී. |
| 24 | 2151/44<br>2019.11.28 | 2019.11.29 | මාළු | කිලෝවට 10 % හෝ 100/= | 25/= | වෙළඳපොළ මිල සහ ජීවන වියදම් කමිටුවෙහි නිර්දේශ සැලකිල්ලට ගනිමින් විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතෙහි 05 වැනි වගන්තිය යටතේ තීරු බදු ඉවත් කිරීම සඳහා වලංගු කාලය මාස 02 කින් දීර්ඝ කරන ලදී. |
| | | | කුඩු නොකරන ලද මිරිස් | 25/= | 5 /= | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 25 | 2153/28<br>2019.12.13 | 2019.12.14 | තිරිඟු පිටි | CID15 %<br>හෝ<br>කිලෝවට<br>16/=<br>CESS<br>බද්ද15/=<br>PAL බද්ද<br>7.5%<br>NBT බද්ද<br>2% | 8/= | දින 31 ක කාලයක් සඳහා තිරිඟු පිටි ආනයනය සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් හඳුන්වාදෙන ලදී. |
| 26 | 2155/12<br>2019.12.24 | 2019.12.25 | අර්තාපල් | 50/= | 25/= | ඉහළ වෙළඳපොල මිල සැළකිල්ලට ගෙන අර්තාපල් ආනයනය සඳහා පැවති බද්ද කිලෝග්‍රෑමයට රු. 25/-කින් අඩු කරන ලදී. |

මූලාශ්‍රය - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2019

## 2.6 බන්ධිත ගුදම්

බන්ධිත ගුදම් යනු තීරුබදු අයකර ගනු ලබන භාණ්ඩ මුදල් ගෙවීමකින් තොරව ගබඩා කළ හැකි, හැසිරවිය හැකි හෝ නිෂ්පාදන ක්‍රියාවලීන් යටතට පත් කළ හැකි ගොඩනැගිල්ලක් හෝ වෙනත් සුරක්ෂිත ප්‍රදේශයකි. එය රජය විසින් හෝ පෞද්ගලික ව්‍යවසායකයන් විසින් පාලනය කරනු ලැබිය හැකිය.

රේගු ආඥා පනතේ 69 වන වගන්තියට අනුව, අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, අදාළ බදු සහ වෙනත් ගාස්තු අයකරගනු ලැබීමෙන් පසුව ආනයන භාණ්ඩ බන්ධිත ගුදම් තුළ බන්ධිත භාණ්ඩ වශයෙන් තබා ගැනීම සඳහා සුදුසු ගොඩනැගිල්ලක් ස්ථානයක් තෝරා ගැනීමට රේගු අධ්‍යක්ෂවරයාට නෛතික බලතල හිමි වේ.

වර්තමානයේදී බන්ධිත ගුදම් වර්ගීකරණය කාණ්ඩ 02 ක් යටතේ සිදුවේ.

- පොදු ගුදම්

පොදු ගුදම් යනු වෙනත් ආනයනකරුවන් විසින් ඉඩ වෙන්කරගනු ලැබීමෙන් පසු රේගු දෙපාර්තමේන්තුවෙහි අනුමැතිය පරිදි ගාස්තු අයකරගත හැකි භාණ්ඩ ගබඩාකොට තැබීම සඳහා පවත්නා පහසුකමකි.

- පෞද්ගලික ගුදම්

  පෞද්ගලික ගුදම් යනු රේගු දෙපාර්තමේන්තුවට අයත් ආනයන ගාස්තු හෝ තීරුබදු අයකිරීමකින් තොරව ගබඩාකොට තැබීම සඳහා දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණය යටතේ පෞද්ගලික සමාගම් විසින් ක්‍රියාත්මක කරනු ලබන ගුදම් පහසුකමය. එයට පහත දැක්වෙන ගුදම් අයත් වේ.

- දේශීය පරිභෝජනය සහ ප්‍රති - අපනයනය සඳහා සීනි සහ සහල් ඇතුළු භාණ්ඩ සැපයුම සඳහා ගුදම්
- අපනයන අභිමුඛ ව්‍යවසායන් සඳහා භාණ්ඩ සැපයීම සඳහා ගුදම්
- නැව්තොට හෝ ගුවන් තොටුපල සේවා / තීරුබදු රහිත සාප්පු සැපයුම් සේවා සඳහා  ගුදම්
- නැව් / ගුවන් යානා සඳහා භාණ්ඩ සැපයීම සඳහා ගුදම්
- රේගු නිෂ්පාදන යටතේ වන භාණ්ඩ සඳහා ගුදම්
- විවිධ රටවලින් පැමිණෙන භාණ්ඩ තොග සඳහා ගුදම්
- මගීන් රහිතව පැමිණෙන ගමන් මළු නිදහස් කිරීම සඳහා ගුදම්
- සීඝ්‍රගාමී භාණ්ඩ නිදහස් කිරීම සඳහා ගුදම්

රේගු ආඥා පනතේ 69 වන වගන්තියට අනුව, 2016 වර්ෂයේදී, පොදු ගුදම් හඳුන්වාදෙනු ලැබීය. ඒ අනුව පොදු ගුදම් ප්‍රතිපත්තිය සඳහා අදාළ කරගනු ලබන කාණ්ඩ 2016 වර්ෂයෙහි අයවැය කථාවෙහි නියෝග පරිදි නිශ්චය කරන ලදී. කෙසේ වෙතත්, ඉහත ප්‍රතිපත්තිය මගින් හඳුන්වාදුන්  වර්ග අඩි 50,000 ක අවම බිම් ප්‍රමාණය සම්බන්ධයෙන් පෞද්ගලික ගුදම් හසුරුවන්නන් විසින් විරෝධතා දක්වන ලදී. ඒ, ගුදමක් සඳහා අවශ්‍ය වන ඉඩකඩ තීරණය කරනු ලැබිය යුත්තේ අදාළ භාණ්ඩවල සවභාවය සැලකිල්ලට ගැනීමෙන්ය යන පදනමෙනි. ඔවුන් පෙන්වා දෙනු ලැබුවේ හඳුන්වාදුන්  වර්ග අඩි 50,000 ක බිම් ප්‍රමාණය අනවශ්‍ය ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදමක් විය හැකි බවත් අවසානයේදී එය ව්‍යාපාර අකාර්යක්ෂමතාව සහ ලාභ අවම වීමට තුඩු දිය හැකි බවත් ය. අදාළ පාර්ශ්වකරුවන් හා පැවැත්වූ සාකච්ඡාවලින් අනතුරුව, පෞද්ගලික ගුදම් සඳහා නව ප්‍රතිපත්ති රාමුවක් හඳුන්වාදෙන ලදී.

## 2.7 විදේශ විනිමය පනත ක්‍රියාත්මක කිරීමේ කටයුතු සම්බන්ධීකරණය

2017 අංක 12 දරණ විදේශ විනිමය පනත

2017 අංක 12 දරණ විදේශ විනිමය පනතෙහි 7 වැනි වගන්තිය අනුව, ආයෝජනය සඳහා අවසරදී ඇති විදේශ විනිමය වලින් සිදුකරන ප්‍රාග්ධන ගනුදෙනු පන්ති සහ එහි සීමාවන්, ඊට අදාළ කොන්දේසි දැක්වීම සඳහා බලය පැවරීමේ නියම හා නියෝග නිකුත් කිරීම අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව මුදල් අමාත්‍යවරයා විසින් සිදු කළ හැකිය.

එසේ නිකුත් කරනු ලැබූ නියම හා නියෝග ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු මාස 03 ක කාලයක් ඇතුළත ඒ සඳහා පාර්ලිමේන්තුවෙහි අනුමැතිය ලබා ගත යුතුවේ. ඒ අනුව, පහත දැක්වෙන නියෝග 03 සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත්කොට ඇත. (වගුව 2.19) එමෙන්ම, දැනට පවතින නියාමන හා නියෝග සංශෝධනය කිරීම සඳහා නියාමන 05 ක් සහ නියෝග 02 ක් සඳහා සංශෝධනය කළ යුතු පාඨ නීති කෙටුම්පත් සම්පාදක වෙත යවා ඇත. (වගුව 2.20)

**වගුව -2.19 2017 අංක 12 දරණ විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ නිකුත් කල නව නියෝග සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට ඉදිරිපත් කල අමාත්‍ය මණ්ඩල සංදේශ**

| අංකය | අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය | විෂය | දිනය |
|---|---|---|---|
| 01. | 19/0657/108/055 | ශ්‍රී ලංකා රජය සහ ශ්‍රී ලංකා රජය සතු ව්‍යවසාය | 2019.02.20 |
| 02. | 19/0172/108/029 | ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීමේ වැඩසටහන | 2019.01.11 |
| 03. | 19/3533108/220 | ආයෝජනය සඳහා අවසරදී ඇති විදේශ විනිමය වලින් සිදුකරන ප්‍රාග්ධන ගනුදෙනු පන්ති , එහි සීමාවන් සහ ආනුෂංගික කොන්දේසි | 2019.10.04 |

**වගුව - 2.20 2017 අංක 12 දරණ විනිමය පනත යටතේ නිකුත් කර ඇති නියෝග හා නියමයන් සඳහා යෝජිත සංශෝධන සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට ඉදිරිපත් කල අමාත්‍ය මණ්ඩල පත්‍රිකා**

| අංකය | නියමයෙහි/ නියෝගයෙහි නම |
|---|---|
| 01 | 2019 අංක 1 දරන විදේශ විනිමය නියෝගය (ශ්‍රී ලංකාවෙහි පදිංචි තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී භාරගනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු පන්ති) |
| 02 | 2019 අංක 2 දරන විදේශ විනිමය නියෝගය (ශ්‍රී ලංකාවෙහි පදිංචි තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාව තුළ |

| | |
|---|---|
| | දී භාරගනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු පන්ති) |
| 03 | 2019 අංක 3 දරන විදේශ විනිමය නියෝගය (විශ්‍රාමික ප්‍රේෂණ) |
| 04 | 2019 අංක 4 දරන විදේශ විනිමය නියෝගය (විවිධ ප්‍රාග්ධන ගනුදෙනු පන්ති) |
| 05 | 2019 අංක 5 දරන විදේශ විනිමය නියෝගය (විදේශ විනිමය ගනුදෙනු පවත්වාගෙන යෑම සඳහා ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යෑම) |
| 06 | 8 වැනි වගන්තිය යටතේ නියෝගය |
| 07 | 31 වැනි වගන්තිය යටතේ නියෝගය |

පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කරනු ලැබූ ගැටළු සැලකිල්ලට ගනිමින්, විදේශ විනිමය පනත ක්‍රියාත්මක කිරීමේදී ඇතිවිය හැකි ගැටළු අවම කරගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය පනතෙහි ඇතැම් වගන්ති සංශෝධනය කරන මෙන් ඉල්ලා ඇත. ඒ අනුව, යෝජිත සංශෝධනය සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කොට ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සකස් කළ කෙටුම්පත එහි කටයුතු අවසන් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත යවා ඇත.

යම් බලයලත් වෙළෙන්දෙකු හෝ බලයනොලත් වෙළෙන්දකු විදේශ විනිමය පනත හෝ පනත යටතේ නිකුත් කරනු ලැබ ඇති නියෝග, නියාමවල දක්වා ඇති ආකාරයට පටහැණිව ක්‍රියාකරනු ලබන අවස්ථාවකදී ඔවුනට දඩුවම් ලබා දීමට පෙර ශ්‍රී ලංකා මහ බැංකුව හෝ අමාත්‍ය මණ්ඩලය විසින් එවැනි වෙළඳුන්ට විදේශ විනිමය පනත හෝ පනත යටතේ නිකුත් කරනු ලැබ ඇති නියෝග, නියාමවල දක්වා ඇති ආකාරයට අනුකූලව කටයුතු කරන මෙන් දැනුම් දෙනු ලැබිය හැකිය. ඒ අනුව, මෙම දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ගරු අමාත්‍යවරයාගේ අවධානයට යොමුකිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පහසුකම් සපයා ඇත.

වගුව -2.21

**2017 අංක 12 දරණ විනිමය පනතේ අංක 11 වගන්තිය යටතේ ඇමතිතුමා විසින් ප්‍රදානය කරන ලද අනුමැතීන්**

| අංකය | නම | අමාත්‍යවරයා වෙතු දැනුම් දුන් දිනය |
|---|---|---|
| 1 | ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑනස් ලිමිටඩ් (LCBFL) | 2019.12.27 |
| 2 | ඩී.එෆ්.සී.සී බැන්ක් පී.එල්.සී (D.F.C.C) | 2019.11.07 |
| 3 | ග්ලෝබල් ට්‍රස්ට් මනී එක්ස්චේන්ජ් ප්‍රයිවෙට් ලිමිටඩ් (GTMEPL) | 2019.12.09 |
| 4 | ශාරංග මනී එක්ස්චේන්ජ් වෙට් ප්‍රයිවෙට් ලිමිටඩ් (SMEPL) | 2019.11.14 |
| 5 | ස්විස් මනී එක්ස්චේන්ජ් ප්‍රයිවෙට් ලිමිටඩ්(SMEPL) | 2019.10.28 |
| 6 | ගෝල් මනී එක්ස්චේන්ජ් ප්‍රයිවෙට් ලිමිටඩ් (GMEPL) | 2019.10.24 |
| 7 | ජෝර්ජ් මයිකල් හෝල්ඩිංස් ප්‍රයිවෙට් ලිමිටඩ්(GMHPL) | 2019.10.08 |
| 8 | කාර්ලෝ ඉන්ටර්නැෂනල් ප්‍රයිවෙට් ලිමිටඩ්(CIPL) | 2019.10.08 |
| 9 | කාර්ලෝ ඉන්ටර්නැෂනල් ප්‍රයිවෙට් ලිමිටඩ් (CIPL) | 2019.10.08 |
| 10 | එල්.ඕ.එල්. සී. ෆිනෑන්ස් ප්‍රයිවෙට් ලිමිටඩ්(LFP) | 2019.09.28 |
| 11 | ලංකා බැංකුව | 2019.09.27 |
| 12 | මිඩ්නා මිනි මාර්කට් ප්‍රයිවෙට් ලිමිටඩ්(MMMPL) | 2019.09.28 |
| 13 | සම්පත් බැන්ක් පී.එල්.සී. | 2019.09.05 |
| 14 | සිංගර් ෆිනෑන්ස් (ලංකා) ප්‍රයිවෙට් ලිමිටඩ්(SFPL) | 2019.08.29. |
| 15 | තෝමස් කුක් ලංකා ප්‍රයිවෙට් ලිමිටඩ් | 2019.08.29 |
| 16 | ගෙක්සන් එක්ස්චේන්ජ් ප්‍රයිවෙට් ලිමිටඩ්(GEPL) | 2019.08.26 |
| 17 | සෙන්ට්‍රල් මනී එක්ස්චේන්ජ් ප්‍රයිවෙට් ලිමිටඩ්(CMEPL) | 2019.08.13 |
| 18 | වෙස්ටර්න් මනී එක්ස්චේන්ජ් ප්‍රයිවෙට් ලිමිටඩ්(WMEPL) | 2019.08.06 |
| 19 | බ්රෙසිකා ග්‍රාමීන් ප්‍රයිවෙට් ලිමිටඩ්(BGPL) | 2019.08.01 |
| 20 | නැෂනල් ඩිවෙලප්මන්ට් බැන්ක් (NDB) | 2019.06.07 |
| 21 | හැටන් නැෂනල් බැන්ක් පී.එල්. සී.(HNB) | 2019.04.23 |

ඉහත කරුණු හැරුණු විට, මෙම දෙපාර්තමේන්තුව මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත, ගෙවීම් උපක්‍රම වංචා පනත සහ ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මූල්‍ය බුද්ධි ඒකකයට අදාළ කටයුතු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇති අධිකාරය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මැදිහත් වේ.

ඒ අනුව, මූල්‍ය ගනුදෙනු පිළිබඳ කාර්යය බලකායෙහි "අළු ලැයිස්තුවෙන්" ශ්‍රී ලංකාව ඉවත් කරගැනීම සඳහා, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ මූල්‍ය ත්‍රස්තවාදය සඳහා මූල්‍යාධාර සැපයීම පිටුදැකීම සම්බන්ධයෙන් නියාමන සකස් කිරීමේ ජාත්‍යන්තර ප්‍රතිපත්ති සකසන්නා වශයෙන් ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මූල්‍ය බුද්ධි ඒකකයට මෙම දෙපාර්තමේන්තුව සහාය පිරිනමන ලදී.

## 2.8 රේගු කටයුතු පිළිබඳ අභියාචනා

රේගු ආඥාපනතේ 164 සහ 165 වගන්ති ප්‍රකාරව, අගතියට පත් පාර්ශව විසින් කරන ලද අභියාචනා සලකා බැලීම සඳහා ගරු අමාත්‍යවරයාට බලය ඇත. ඒ අනුව, 2019 වර්ෂයේදී වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ලැබුණු එවැනි පහත සඳහන් පරිදි වේ.

වගුව **2.22 -** රේගු කටයුතු පිළිබඳ අභියාචනා

| අංකය | අභියාචනා අංකය | අභියාචක |
|---|---|---|
| 01 | CIB/INV/168/2018 | එම්/එස් ඔටෝ බැවේරියා |
| 02 | PREV/2018/00426 | ලංකා කෝල් පුද්ගලික සමාගම |
| 03 | BIA/D/CASE/110/2015 | එම්.ජේ.එම්. නිසාඕස් මයා |
| 04 | PCAD/RMU/14-23/2018<br>PCAD/RMU/26-29/2018<br>PCAD/RMU/32/2018<br>PCAD/RMU/35/2018 | ඒ.ජී.පී. ට්‍රේඩර්ස් |
| 05 | PREV/114/2016 | සේන මිල්ස් රිෆයිනරීස් පුද්ගලික සමාගම |
| 06 | CIU/INV/062/2008 | වෙසල් එම්.වී. යුනි ග්ලෝරි පුද්ගලික සමාගම |
| 07 | INDS/BIU/2008/00008/CCR/00627 | ප්‍රිමියර් පැකේජිං පුද්ගලික සමාගම |
| 08 | RBF Case No ICT/187/2014<br>RBF Case No ICT/188/2014 | රේන්බෝ ෆැෂනස් පුද්ගලික සමාගම |
| 09 | BIA/D/CASE/258/2018 | කේ.කේ. බාලමැණිකේ මිය |
| 10 | CIB/INV/150/2018 | මනෝජ් බොල්ලැගල මයා |
| 11 | PCAD/AD004/058/2018 | එම්.ඩබ්.ඉඩම්ගොඩ මයා |
| 12 | CIU/INV/047/2011 | තෝමස් වසන්තන් ප්‍රනාන්දු මයා |
| 13 | CRTF/1090/2018 | කේ. මංජු ශ්‍රී තාබෲ මයා |
| 14 | PCAD/HQO/099/2016/CCR/04539 | එම්/එස් ජැට් හෝල්ඩිංස් පුද්ගලික සමාගම |
| 15 | BIA/D/169/2018 | එල්.ඩී.කේ. මෙන්ඩිස් සහ එල්.සී.කේ. මෙන්ඩිස් මහත්වරු |
| 16 | CIB/INV/493/2015 | එම්/එස් ඇලරිස් ලංකා පුද්ගලික සමාගම |

ඉහත සිදුවීම්, නීති විරෝධී ආනයන - අපනයන, බදු වංචා, හෙළිදරව් නොකිරීම් සහ ව්‍යාජ හෙළිදරව් කිරීම්, සංයෝජිත වර්ගීකරණ කේතාංකවල අසමානතාවන් ආදිය සම්බන්ධයෙනි. ඒ අනුව, රේගු නියෝගවලට එරෙහිව ලැබුණු අභියාචනා 16 සම්බන්ධයෙන්ම රේගු දෙපාර්තමේන්තවෙහි නිරීක්ෂණ ඉල්ලා සිටින ලදී. 2019 වර්ෂයට පෙර ලැබුණු අභියාචනා ද ඇතුළුව ඒ සම්බන්ධ වාර්තා 17 ක් ගරු අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ අතර ඉන් 15ක් සඳහා අනුමැතිය හිමි වූ අතර අභියාචනා 2ක් ප්‍රතික්ෂේප වී ඇත.

## 2.9 අධිකරණ නඩු

රේගු ආඥාපනත, විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත සහ ආදායම් ආරක්ෂණ පනත යටතේ ගනු ලැබූ තීරණ හෝ ක්‍රියාමාර්ග හේතුවෙන් අගතියට පත් පාර්ශවයන් ඒ පිළිබඳව අධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කරනු ලබයි. මෙම දෙපාර්තමේන්තුවට හෝ මුදල් අමාත්‍යාංශයට එරෙහිව ගොනු කර ඇති අධිකරණ නඩු සම්බන්ධ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම හා ඊට අදාල අනිකුත් කාර්යයන් පිළිබඳව වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරනු ලබයි. අධිකරණ තුළ දැනට පවත්නා නඩු වෙළෙඳ, බලපත්‍ර නිකුත් කිරීම්, බදු, විදේශ වෙළෙඳ ගිවිසුම් යනාදි විෂයන්ට සම්බන්ධ ඒවා වේ.ඉහත සඳහන් අධිකරණ ක්‍රියාමාර්ග වලට අදාලව සකස් කළ නිරීක්ෂණ සංඛ්‍යාව 12 සහ ක්‍රියා කළ නඩු සංඛ්‍යාව 23 ක් වේ.

## 2.10 විශේෂ ව්‍යාපෘති අංශය

### 2.10.1 රාජ්‍ය නිලධාරීන් සඳහා සහනදායී කොන්දේසි මත වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ යෝජනා ක්‍රමය

අංක 01/2018 දරන වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රෙල්ඛය 2018 පෙබරවාරි 15 වැනි දින නිකුත් කරනු ලැබූ අතර, 2018 ජූනි 8, 2018 සැප්තැම්බර් 11, සහ 2019 නොවැම්බර් 13 යන දිනවලදී පිළිවෙළින් 01/2018 (1), 01/2018 (2), 01/2018 (4), යන සංශෝධන ඊට සිදු කරන ලදී. කෙසේවෙතත්, බලපත්‍ර දෙකක් නිකුත් කිරීම අතරතුර වර්ෂ 05 ක කාල පරිච්ඡේදය ගණනය කිරීමෙහි ක්‍රමවේදය සංශෝධනය කිරීම සඳහා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයෙහි තෙවැනි සංශෝධනය එහි සිව්වැනි සංශෝධනය මගින් අවලංගු කරන ලදී. එකී සංශෝධනය යටතේ මුදල් අමාත්‍යාංශයෙහි සහ මුදල් අමාත්‍යාංශය යටතට ගැනෙන වෙනත් දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන ලද නිලධාරීන් සඳහා නිකුත් කරන ලද මෝටර රථ බලපත්‍ර සංඛ්‍යාව 233 කි. වෙනත් ආයතන මගින් ඉදිරිපත් කරනු ලැබ ඇති තොරතුරුවලට අනුව 2019 වර්ෂයේදී (මුදල් අමාත්‍යාංශය වෙත නිකුත් කොට ඇති මෝටර බලපත්‍ර සංඛ්‍යාවද ඇතුළත්ව) මෙම යෝජනා ක්‍රමය යටතේ නිකුත් කොට ඇති මෝටර රථ බලපත්‍ර සංඛ්‍යාව 7632 කි. ( මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි නිලධාරීන් සඳහා නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව ද ඇතුලත්ව )

### 2.10.2 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 යටතේ බලපත්‍ර ලබාදීම

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 සහ එහි සංශෝධන විධිවිධාන යටතේ, රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විශ්‍රාම යන අවස්ථාවේදී ඔවුන් සඳහා වාහන බලපත්‍ර නිකුත් කරනු ලැබේ. වාහන බලපත්‍ර දෙකක් නිකුත් කිරීම අතරතුර වන අවුරුදු 05 කාල පරිච්ඡේදය සහ රජයේ විශේෂඥ වෛද්‍ය නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාමයාමේ වයස සංශෝධනය කිරීම සඳහා පිළිවෙළින් 2019 ඔක්තෝබර් 10 සහ 2019 දෙසැම්බර් 12 යන දිනවලදී , රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 (XXXVI) සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 (XXXVII) යන සංශෝධනයන් නිකුත් කර ඇත.

2019 වසර තුළදී, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 සහ එහි සංශෝධිත විධිවිධාන යටතේ වාහන ආනයන බලපත්‍ර සඳහා අයදුම්පත්‍ර 500 ලැබී ඇති අතර ඒ අතරින් සුදුසුකම් සම්පූර්ණ කරන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 465 දෙනෙකු සඳහා වාහන බලපත්‍ර නිකුත් කර ඇත. ලැබුණු අයදුම්පත් අතරින් අයදුම්පත්‍ර 12 ප්‍රතික්ෂේප කර ඇති අතර අඩුපාඩු කැඳවා ඇති අයදුම්පත් 23 ක් සඳහා බලපත්‍ර ලබාදීමට නියමිතව ඇත. මෙම වර්ෂය තුළදී අභියාචනා 58 ලැබී ඇති අතර එයින් අභියාචනා 4 සඳහා පිළිතුරු ලබා දීමට ඉතිරිව ඇත.

**2.10.3 රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 210 යටතේ සහනදායී කොන්දේසි මත මෝටර් රථ ආනයනය කිරීමේ යෝජනා ක්‍රමය**

2019 මාර්තු 05 දිනැති අංක 2113/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ දක්වා ඇති විධිවිධාන අනුව, විදේශ රටවල සේවය කරන ශ්‍රී ලංකා දූත මණ්ඩලය නිලධාරීන් සඳහා සහනදායී කොන්දේසි යටතේ මෝටර රථ ආනයනය කිරීමේ යෝජනා ක්‍රමය යටතේ තීරුබදු ඉවත් කිරීම සඳහා 2019 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව විසින් ලිපි 22 ක් නිකුත් කොට ඇත.

**2.10.4 විවිධ බදු සහන යටතේ ආනයනය කරන ලද වාහන අපහරණය කිරීම**

2019 වර්ෂය තුල විවිධ බදු සහන යෝජනා ක්‍රම යටතේ මෙරටට ආනයනය කරන ලද වාහන 52 ක් අපහරණය කිරීම සඳහා පහසුකම් සපයා ඇත.

**2.10.5 බදු නිදහස් කිරීම**

රේගු අඥා පනතේ 19 (අ) වගන්තිය (235 වැනි අධිකාරිය) යටතේ අමාත්‍ය මණ්ඩලයෙහි අනුමැතිය සහිත විශේෂ ව්‍යාපෘති සම්බන්ධයෙන් රේගු ආනයන බදු කපා හැරිය හැකිය. ඒ අනුව, 2019 වසරේදී මාර්ග සහ මහා මාර්ග, ගුවන් තොටුපොල හා ගුවන් සේවා, වරාය හා ධීවර වරාය, ජලසම්පාදන හා වාරිමාර්ග, විදුලිබල, නිවාස යෝජනා ක්‍රම, රෝහල් හා විශ්වවිද්‍යාල ඉදි කිරීම් ආදී ක්ෂේත්‍රයන් ආවරණය කරන ලද ව්‍යාපෘති සඳහා තීරුබදු කපා හැරීම් පිරිනමන ලදී. 2019 වසරේදී පිරිනමනු ලැබූ බදු කපාහැරීම්වල සාරාංශයක් පහත 2.23 වගුවෙහි දැක්වේ.

**2.23 වගුව - රේගු අඥා පනතේ 19 (අ) වගන්තිය යටතේ විශේෂ ව්‍යාපෘති සඳහා 2019 වසරේදී පිරිනමනු ලැබූ බදු කපාහැරීම්**

| අංකය | අංශය | බදු කපා හැරීම් සඳහා නිකුත් කළ ලිපි සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ආරක්ෂක | 54 |
| 2 | අධ්‍යාපන | - |
| 3 | සෞඛ්‍ය | 121 |
| 4 | යටිතල පහසුකම් | 517 |
| 5 | ජල සම්පාදන | 525 |
| 6 | වෙනත් | 408 |
| **එකතුව** | | **1625** |

මූලාශ්‍රය - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව - 2019

අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මෙම දෙපාර්තමේන්තුව විසින් තීරු බදු කපා හැරීම සඳහා බලය පැවරී ඇති 2019 වර්ෂය තුළදී ලබා දුන් තීරු බදු කපා හැරීම් පිළිබඳ සාරාංශයක් 2.24 වගුවේ දක්වා ඇත.

**2.24** වගුව **-** රේගු ආඥා පනතේ **19 (අ)** වගන්තිය යටතේ තීරු බදු කපා හැරීම

| අංකය | අයිතමය | රේගු ආනයන බදු අනුපාතය | බදු කපා හැරීම (රු.) | අයකරගත හැකි රේගු ආනයන බදු (රු) | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|---|
| 1 | ඩීසල් | සුපර් ඩීසල් - ලීටරයට 10.55 | බදු කපාහැරීම් නොමැත | ලීටරයට 10.55/- | 2018.11.20 සිට 2019.01.11 දක්වා |
| | | ඩීසල් -ලීටරයට 5.85 | ලීටරයට 5/- | ලීටරයට 0.85 /- | |
| | | වෙනත් ඩීසල් - ලීටරයට 10.55 | බදු කපාහැරීම් නොමැත | ලීටරයට 10.55/- | |
| | | | | | |
| | | සුපර් ඩීසල් - ලීටරයට 10.55 | බදු කපාහැරීම් නොමැත | ලීටරයට 10.55/- | 2019.01.12 සිට 2019.06.11 දක්වා |
| | | ඩීසල් -ලීටරයට 5.85 | ලීටරයට 3/- | ලීටරයට 2.85/- | |
| | | වෙනත් ඩීසල් - ලීටරයට 10.55 | බදු කපාහැරීම් නොමැත | ලීටරයට 10.55 /- | |
| | | | | | |
| | | සුපර් ඩීසල් - ලීටරයට 15/- | ලීටරයට 1/- | ලීටරයට 14/- | 2019.06.12 සිට 2019.07.10 දක්වා |
| | | ලීටරයට 5.85/- | ලීටරයට 3/- | ලීටරයට 2.85/- | |
| | | වෙනත් ඩීසල්-15 /- | බදු කපාහැරීම් නොමැත | ලීටරයට 15/- | |
| | | | | | |
| | | සුපර් ඩීසල් - ලීටරයට 15 /- | බදු කපාහැරීම් නොමැත | ලීටරයට 15/- | 2019.07.11 සිට අද දක්වා |
| | | ඩීසල් ලීටරයට 5.85 /- | ලීටරයට 3/- | ලීටරයට 2.85 /- | |
| | | වෙනත් ඩීසල් - ලීටරයට -15/- | බදු කපාහැරීම් නොමැත | ලීටරයට 15 /- | |
| | | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2 | පෙට්‍රල් | ඔක්ටේන් 92 ලීටරයට 35/-<br>ඔක්ටේන් 95 ලීටරයට 35/-<br>වෙනත් - ලීටරයට 35/- | ඔක්ටේන් 92 - ලීටරයට 20/-<br>ඔක්ටේන් 95- බදු කපා හැරීම් නොමැත<br><br>වෙනත් - බදු කපා හැරීම් නොමැත | ඔක්ටේන් 92 - ලීටරයට 15/-<br>ඔක්ටේන් 95- ලීටරයට 35/-<br><br>වෙනත් - ලීටරයට 35/- | 2018.12.29 සිට 2019.01.11 දක්වා |
| | | | | | |
| | | | ඔක්ටේන් 92 - ලීටරයට 19/=<br>ඔක්ටේන් 95- බදු කපා හැරීම් නොමැත<br><br>වෙනත් - බදු කපා හැරීම් නොමැත | ඔක්ටේන් 92 - ලීටරයට 16/-<br>ඔක්ටේන් 95- ලීටරයට 35/-<br><br>වෙනත් - ලීටරයට 35/- | 2019.01.12 සිට 2019.06.11 දක්වා |
| | | | | | |
| | | ඔක්ටේන් 92 - ලීටරයට 35/-<br>ඔක්ටේන් 95- ලීටරයට 35/-<br><br>වෙනත් - ලීටරයට 35/= | ඔක්ටේන් 92 - ලීටරයට 18/-<br>ඔක්ටේන් 95- බදු කපා හැරීම් නොමැත<br>වෙනත් - බදු කපා හැරීම් නොමැත | ඔක්ටේන් 92 - ලීටරයට 17/-<br>ඔක්ටේන් 95- ලීටරයට 35/-<br>වෙනත් - ලීටරයට 35/- | 2019.06.12 සිට 2019.09.10 දක්වා |
| | | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | ඔක්ටේන් 92 - ලීටරයට 35/-<br>ඔක්ටේන් 95- ලීටරයට 35/-<br>වෙනත් - ලීටරයට 35/- | ඔක්ටේන් 92 - ලීටරයට 17/-<br>ඔක්ටේන් 95- බදු කපා හැරීම් නොමැත<br>වෙනත් - බදු කපා හැරීම් නොමැත | ඔක්ටේන් 92 - ලීටරයට 18/-<br>ඔක්ටේන් 95- ලීටරයට 35/-<br>වෙනත් - ලීටරයට 35/- | 2019.09.11 සිට අද දක්වා |
| 3 | ලිහිසි තෙල් | 15% | 3% | 12% | 2019.11.02 සිට අද දක්වා |
| 4 | ඉරිඟු ඇට | 15% හෝ කි.ග්‍රෑමයට රු.12/- | කි.ග්‍රෑමයට රු.9/- | කි.ග්‍රෑමයට රු.3/- | 2018.11.02 සිට 2019.12.13 දක්වා |
| | | | කි.ග්‍රෑමයට 15% හෝ රු.12/- | නිදහස් | 2019.12.14 සිට අද දක්වා |
| 5 | කිරිපිටි | 20% හෝ කි.ග්‍රෑමයට රු.225/- | කි.ග්‍රෑමයට රු.210/- | කි.ග්‍රෑමයට රු.15/- | 2018.10.17 සිට අද දක්වා |
| 6 | කජු මද | 30% | 30% | නිදහස් | 2017.10.07 සිට අද දක්වා |

**CID : රේගු ආනයන තීරුබදු**

මූලාශ්‍රය - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව - 2019

### 2.10.6 අපනයන සැකසුම් යෝජනා ක්‍රමය සඳහා ආනයනය.

ශ්‍රී ලංකාව සඳහා ප්‍රමාණවත් ආදායමක් (විදේශ විනිමය) උපයා ගැනීම සඳහා අපනයන ප්‍රවර්ධනය ඇති කිරීම පිළිබඳව වෙළඳ පහසුකරණය සැලසීමේ පියවරන් වශයෙන් මෙම යෝජනා ක්‍රමය හඳුන්වාදෙනු ලැබීය. මෙම යෝජනා ක්‍රමය යටතේ, වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය යටතේ ලියාපදිංචිව ඇති ආයෝජකයන් සඳහා පහසුකම් සැලසේ. මෙම යෝජනා ක්‍රමය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සැකසුම මෙම දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලැබේ.

ඒ අනුව, අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයන යෝජනා ක්‍රමය යටතේ, ආනයන කරනු ලබන කුළුබඩු සහ ඊට අයත් නිෂ්පාදන ඉවත් කිරීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා ආයෝජන මණ්ඩල පනතෙහි 4 වැනි වගන්තිය සංශෝධනය කිරීම සඳහා 2019.03.26 දිනැති අංක 2116/7 දරන ගැසට් නිවේදනයක් නිකුත් කොට ඇත. අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයන යෝජනා ක්‍රමය යටතේ කළු ගම්මිරිස්, පුවක්,සාදික්කා / වසාවාසි, සියඹලා සහ කුරුඳු ආනයනයට අදාළ 1998.11.1 දිනැති අංක 1053/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදී.

## 2.11 වෙනත් අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සකස් කිරීම සහ මෙම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම.

2019 වර්ෂයේදී, විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත, ආදායම් සංරක්ෂණ ආඥා පනත, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.22/99 සහ අදාළ වෙනත් කරුණු යටතේ, අමාත්‍ය මණ්ඩල සංදේශ 13 ක් මෙම දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදි. එමෙන්ම, වෙනත් අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ 26 ක් ද මෙම දෙපාර්තමේන්තුව මඟින් ඉදිරිපත් කොට ඇත.

## 2.12 සාර්ක් සංවර්ධන අරමුදල

සාර්ක් සංවර්ධන අරමුදල යනු ව්‍යාපෘති සහයෝගීතාවය තුළින් කලාපීය සහයෝගීතාවය සහ ඒකාබද්ධතාවය ඇති කිරීම සඳහා දායකත්වය ඉලක්ක කර ගත් මූල්‍යාධාර සපයන ආයතනයකි. 2010 වසරේ සිට සාර්ක් සංවිධානය තුළ ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා මූල්‍යාධාර සපයන ඒකාබද්ධ සංවිධානයක් වශයෙන් ක්‍රියාත්මක වන සාර්ක් සංවර්ධන අරමුදල සාර්ක් කලාපීය රටවල්වල ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සහ ආර්ථික වර්ධනය වේගවත් කිරීම සමාජ අභිවෘද්ධිය ඇති කිරීම සහ දිළිඳු බව අවම කිරීම තුළින් සුබ සාධනය ඇති කිරීම සඳහා ක්‍රියාත්මක වේ.

සාර්ක් සංවර්ධන අරමුදල තුළ මූල්‍යන කවුළු 03 කි.

**(i) සමාජීය කවුළුව**

මෙ මඟින් මූලික වශයෙන් අධ්‍යාපනය, සෞඛ්‍ය, මානව සම්පත් සංවර්ධනය, සමාජය තුළ අවම පහසුකම් සහිතව දිවි ගෙවන්නන් අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක ව්‍යාපෘති සඳහා මූල්‍යාධාර සැපයේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන නියෝජිත ආයතන සමඟ සම හවුල්කාරීත්වය(50:50) ඇතිව ප්‍රදානයන් සිදු කරනු ලබයි.

**(ii) ආර්ථික කවුළුව**

මෙමඟින් මූලික වශයෙන්ම වෙළඳ හා කර්මාන්ත සංවර්ධන, කෘෂිකාර්මික සේවා අංශය, විද්‍යා හා වෙනත් යටිතල පහසුකම් නොවන ක්ෂේත්‍ර සඳහා මූල්‍යාධාර පිරිනැමීම සිදු කරයි.

**(iii) යටිතල පහසුකම් කවුළුව**

මෙමඟින් මූලික වශයෙන්ම, බලශක්තිය, ප්‍රවාහනය, සන්නිවේදනය, පරිසරය, සංචාරක කර්මාන්තය සහ වෙනත් යටිතල පහසුකම් අංශ වල ව්‍යාපෘති සඳහා මූල්‍යාධාර පිරිනැමීම සිදු කරයි. ආර්ථික හා යටිතල පහසුකම් කවුළු මූල්‍යන ක්‍රමය යටතේ 100% සුරක්ෂිත ණය සපයනු ලබයි.

සමාජීය කවුළුව යටතේ සාක් රටවල් තුල ව්‍යාපෘති 13 ක් ක්‍රියාත්මක කෙරෙමින් පවතින අතර සෑම ව්‍යාපෘතියක් මඟින්ම සාර්ක් සාමාජික රාජ්‍යයන් එකකට වැඩි සංඛ්‍යාවක් සඳහා ප්‍රතිලාභ ලබා දෙයි.

සමාජීය කවුළුව යටතේ ශ්‍රී ලංකාව තුල මේ වන විට ව්‍යාපෘති 04 ක් සම්පූර්ණ කොට ඇති අතර ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සංඛ්‍යාව 02 කි. ආර්ථික හා යටිතල පහසුකම් කවුළුව යටතේ සැලසුම් කෙරෙමින් පවතින ව්‍යාපෘති සංඛ්‍යාව 02 කි.

**දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති**

1. සාර්ක් කලාපය තුල ගෘහස්ථ නිෂ්පාදන පදනම් කර ගත් නිෂ්පාදකයින්ගේ ජීවනෝපායන් ශක්තිමත් කිරීම
2. සාර්ක් කලාපය තුල කාන්තාවන්ට හා දරුවන් සඳහා ඔවුන්ගේ ගැටළු විසඳා ගැනීම සඳහා නොමිලයේ උපකාරක දුරකථන සේවා ලබා දීම

**මේ වන විට ව්‍යාපෘති කාර්යයන් සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති**

1. මාතෘ හා ළදරු ප්‍රතිශක්තිකරණය වැඩි දියුණු කිරීම
2. දකුණු ආසියානු කලාපය තුල ළමුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම
3. සාර්ක් කලාපීය රටවල පලතුරු නිෂ්පාදනය සම්බන්ධයෙන් පශ්චාත් අස්වනු කලමණාකරණය හා වටිනාකම් එකතු කිරීම සඳහා වන ව්‍යාපෘතිය
4. සාර්ක් කලාපීය රටවල් වල තෝරා ගත් ප්‍රදේශ සඳහා ජලය, සනීපාරක්ෂාව හා සනීපාරක්ෂක සේවා ශක්තිමත් කිරීම සඳහා වන ව්‍යාපෘතිය.

**සැලසුම් කෙරෙමින් පවතින ව්‍යාපෘති**

1. සාර්ක් රටවල කාන්තා ව්‍යවසායකින්ගේ ශක්‍යතාව ඉහළ නැංවීම සහ ඔවුන් අතර සබඳතා ජාලයක් ගොඩ නැංවීම (සාක් අත්කම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම).

ආර්ථික මූල්‍යාධාර කවුළුව යටතේ, සාර්ක් සංවර්ධන ණය මුදල මෑත කාලීනව ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා මූල්‍යාධාර සැපයීමේ යෝජනා ක්‍රමයට ක්‍රියාවට නංවන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ ඇ.ඩො.මිලියන 10ක් බෙදාහැරීම සඳහා අරමුදල විසින් සැලසුම් සකස් කොට ඇත.
සාර්ක් සංවර්ධන අරමුදලෙහි ශ්‍රී ලාංකික පාර්ශ්වික නියෝජිත ආයතනය වශයෙන් අරමුදලෙහි සමස්ත සම්බන්ධීකරණය, ව්‍යාපෘති යෝජනා නිර්දේශ කිරීම, ව්‍යාපෘති ප්‍රගතිය සමාලෝචනය කිරීම, වාර්ෂික දායක මුදල් ගෙවීම, ශ්‍රී ලංකාවට පැමිණෙන සාර්ක් සංවර්ධන අරමුදලෙහි නිලධාරීන් සඳහා පහසුකම් සැලසීම වැනි කාර්යයන් ඉටු කිරීම මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කෙරේ.

**සාර්ක් මූල්‍ය රැස්වීම්**

වර්ෂ 1998 ජූලි මස 29 වන දින කොළඹදී පැවති 10 වන සාර්ක් සමුළුව අතරතුර එකඟ වූ පරිදි සාර්ක් කලාපීය මහ බැංකු අධිපතිවරුන්ගේ හා සාර්ක් කලාපීය මුදල් ලේකම්වරුන්ගේ කලාපීය සබඳතාවයන් උදෙසා 1998 සැප්තැම්බර් මස 09 වන දින " සාර්ක් මූල්‍යය " (SAARC Finance) ආරම්භ විය. කෙසේ වෙතත් මේ සඳහා විධිමත් පිලිගැනීම ලබාගත හැකි වූයේ වර්ෂ 2002 ජනවාරි මස නේපාලයේ කත්මන්ඩු නුවර පැවති 11 වන සාර්ක් සමුළුව අතරවාරයේදී ය.

සාර්ක් මූල්‍ය ජාලයේ මූලික අරමුණ වන්නේ සාර්ක් රටවල ඇති මහ බැංකු හා මුදල් අමාත්‍යාංශ අතර සම්බන්ධීකරණය වර්ධනය කිරීමත් අන්‍යෝන්‍ය වශයෙන් ඒ ඒ රටවල් විසින් ගනු ලැබූ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ අත්දැකීම් හුවමාරු කරගැනීමත්ය. තවද, සාර්ක් මූල්‍ය පහත සඳහන් අරමුණු වලින් යුතු වේ.

- සාර්ක් කලාපීය රටවල මහ බැංකු හා මුදල් අමාත්‍යංශ අතර සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම උදෙසා කාර්යමණ්ඩල සංචාර හා නිරන්තර තොරතුරු හුවමාරු කිරීම් සිදුකිරීම.
- කලාපීය බැංකුකරණ නීතිරීති සංගෘහිතකරණය කිරීම පිළිබඳ සලකා බැලීම හා යෝජනා කිරීම.

- සාර්ක් කලාපීය රටවල කාර්යක්ෂම ගෙවීම් පද්ධතියක් ඇතිකිරීම සහ මූල්‍ය මෙන්ම විනිමය සම්බන්ධීකරණය උදෙසා කටයුතු කිරීම.
- සමීප සාර්ව ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ අන්‍යෝන්‍ය අත්දැකීම් හා අදහස් හුවමාරු කරගැනීම තීව්‍ර කිරීම.
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව හා අනෙකුත් ජාත්‍යන්තර ණය දෙන සංවිධානවල ඇති මූල්‍ය දියුණුව පිළිබඳව හා ඒවායේ කලාපීය බලපෑම හා ඒ හරහා ඇතිවන ගැටළු පිළිබඳ අධ්‍යයනය කිරීම.
- ජාත්‍යන්තර මූල්‍ය හා මූල්‍ය පද්ධතින්හි ඇතිවන වෙනස්කම් අධීක්ෂණය කිරීම හා එකී වෙනස්කම් සඳහා කලාපීය වශයෙන් සාමූහිකව කටයුතු කිරීම.

- ජාත්‍යන්තර වශයෙන් හා මූල්‍ය සේවා නිදහස් කිරීම හරහා අන්‍යෝන්‍ය ප්‍රතිලාභ ලැබෙන අයුරින් සාධ්‍ය වූත්, සාමූහික විධි ක්‍රම හා උපායමාර්ග පිළිබඳ පොදු වශයෙන් එක්ව තීරණයක් ගැනීම.
- ආර්ථික විද්‍යාව හා මූල්‍යනය සම්බන්ධව විෂය කරුණු පිළිබඳ කලාපීය වශයෙන් මුදල් හා මහ බැංකු කාර්යමණ්ඩල සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මූල්‍ය ප්‍රතිපත්ති, විනිමය අනුපාත වෙනස්කම්, බැංකු අධීක්ෂණය හා ප්‍රාග්ධන වෙළඳපොල ගැටළු සම්බන්ධ කලාපීය පුහුණු ආයතන ජාලකරණය කිරීමට කටයුතු කිරීම සහ,
- අන්‍යෝන්‍ය සුභසිද්ධිය උදෙසා වන ආර්ථික හා මූල්‍ය ගැටළු සම්බන්ධයෙන් කරනු ලබන පර්යේෂණ දිරිගැන්වීම.

## 03. 2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

| අයවැය 2019 | | සටහන | සත්‍ය 2019 | 2018 | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 54,902,000 | 286,870,500 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 446,679 | 28,580 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 7,144,161 | 4,218,369 | ඒසීඒ-5 |
| - | වෙනත් ලැබීම් | | 2,125,801 | 1,745,216 | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 64,618,641 | 292,862,665 | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 64,618,641 | 292,862,665 | |
| | අඩුකළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | | | |
| 37,750,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 36,655,980 | 31,762,118 | |
| 22,075,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 17,803,208 | 15,080,143 | ඒසීඒ-2(ii) |
| 860,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 858,518 | 239,256,028 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| 60,685,000 | මුළු පුනරාවර්තන වියදම් (ඈ) | | 55,317,706 | 286,098,289 | |
| | මූලධන වියදම් | | | | |
| 50,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | - | - | |
| 250,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | - | 806,751 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 500,000 | හැකියා වර්ධනය | 14 | 436,558 | 440,200 | |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | - | |
| 800,000 | මුළු මූලධන වියදම් (ඉ) | | 436,558 | 1,246,951 | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඊ) | | 7,846,099 | 5,791,999 | |
| | තැන්පතු ගෙවීම් | | 446,679 | 58,871 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 7,399,420 | 5,733,128 | ඒසීඒ-5 |
| | මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ) | | 63,600,363 | 293,137,239 | |
| 61,485,000.00 | 2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ) | | 1,018,278 | (274,574) | |

## 3.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

2019.12.31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 59,112,025 | 57,142,905 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5 | 10,249,669 | 9,994,410 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| මුළු වත්කම් | | 69,361,694 | 67,137,315 |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | 10,249,669 | 9,994,410 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 59,112,025 | 57,142,905 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | - | - |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| මුළු වගකීම් | | 69,361,694 | 67,137,315 |

පිටු අංක 4 සිට 20 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 21 සිට 28. දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

..................................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම : එස්. ආර්. ආටිගල
තනතුර : ලේකම්, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
දිනය : 20/2/2020

එස්. ආර්. ආටිගල
මහා භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01

..................................
ගණන්දීමේ නිලධාරී
නම : කේ. ජේ. විමලේන්තිරරාජා
තනතුර : අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 19/02/2020.

කේ. ජේ. විමලේන්තිරරාජා
අධ්‍යක්ෂ ජනරාල්
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

..................................
ගණකාධිකාරී
නම : එස්.ජී.එම්.ඒ.පී.සේනාරත්න
දිනය : 16/02/2020.

එස්. ජී. එම්. ඒ. පී. සේනාරත්න
ගණකාධිකාරී
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

2

## 3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

**2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | තකය 2019 රු. | 2018 රු. |
|---|---|---|
| <u>**මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 2,125,801 | - |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකු කරන ලද ආදායම් | - | - |
| අග්‍රිම ලැබීම් | 54,902,000 | 287,188,854 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **57,027,801** | **287,188,854** |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 54,395,583 | 43,152,863 |
| සහනාධාර සහ මාරුකිරීම් | 858,518 | 239,256,028 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 471,333 | - |
